ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම

வரையறுக்கப்பட்ட இலங்கை நிலக்கரி (தனியார்) நிறுவனம்

Lanka Coal Company (Pvt) Ltd.



වාර්ෂික වාර්තාව
ஆண்ட றிக்கை
Annual Report 2023

www.lankacoal.lk

ස්ථාපිත කිරීම

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම 2006 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් මත 2008 වර්ෂයේදී පිහිටුවනු ලැබූ අතර 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලදි.

දැක්ම

ශ්‍රී ලංකාව තුළ අඛණ්ඩව බලශක්තිය සැපයීමට සහතික කරනු පිණිස ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති ගල්අඟුරු දාහක තාපජනක බලාගාර සඳහා ගල්අඟුරු අවශ්‍ය ගුණාත්මක භාවයෙන් සහ ප්‍රමාණයෙන්, කාර්යක්ෂමව සහ ක්‍රියාශීලීව අවම පිරිවැයකින් ප්‍රසම්පාදනය කිරීම.

මෙහෙවර

ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති ගල්අඟුරු දාහක තාපජනක බලාගාර සඳහා ගල්අඟුරු අවශ්‍ය ප්‍රමාණයෙන් සාධාරණ මිළකට ප්‍රසම්පාදනය කිරීම. ගල්අඟුරු අළු භාවිතා කොට නව නිෂ්පාදන හඳුන්වා දෙමින් පරිසර හිතකාමී ගල්අඟුරු අපද්‍රව්‍ය කළමනාකරණය පද්ධති ක්‍රියාත්මක කිරීම. කර්මාන්තකරුවන්ගේ ආර්ථිකය මෙන්ම රටේ ආර්ථිකයද වඩාත් ශක්තිමත් කිරීමේ විකල්ප බලශක්ති ප්‍රභවයන් ලෙස ඔවුන් වෙත ගල්අඟුරු හඳුන්වාදීම.

පටුන

ආයතනික තොරතුරු	05
සභාපතිගේ පණිවිඩය	07
සංයුක්ත පාලනය	09
සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව	13
අවධානම් කළමනාකරණය	15
කාර්යසාධන සමාලෝචනය	17
අනාගත උපායමාර්ගික සැලසුම්	25
ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය	29
මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය	30
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය	32
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	33
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	35
විගණකාධිපති වාර්තාව	62
විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා ලංකා ගල්අඟුරු සමාගමේ නිරීක්ෂණ	68

ආයතනික තොරතුරු

සමාගමේ නම	: සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම
සමාගම ලියාපදිංචි කිරීමේ අංකය	: පීවී 62636
නෛතික ආකාරය	: 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සීමිත වගකීම් සහිත පුද්ගලික සමාගමකි. අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් මගින් ස්ථාපනය කරන ලද පූර්ණ වශයෙන් රජය සතු ව්‍යාපාර කළමනාකරණය කරනු ලබන සමාගමකි.
ලියාපදිංචි කාර්යාලය	: අංක 51/3, සුරනිමල පෙදෙස, දුටුගැමුණු විදියෙන් පිටත පාර, කොහුවල, දෙහිවල, ශ්‍රී ලංකාව. දු.ක. : +9411 2824681/2 ෆැක්ස් : +94112824689 විද්‍යුත් තැපෑල : info@lankacoal.lk වෙබ් අඩවිය : www.lankacoal.lk
පරිපාලක සමාගම	: ලංකා විදුලිබල මණ්ඩලය අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.
සමාගම් ලේකම්වරු	: සීමාසහිත පී.ඩබ්ලිව්. කෝපරේට් සෙක්‍රටරීස් (පුද්ගලික) සමාගම අංක 3/17, කිංසි පාර, කොළඹ 08.
විගණකවරු	: විගණකාධිපති ජාතික විගණන කාර්යාලය, 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල.
බැංකුකරුවෝ	: මහජන බැංකුව - ආයතනික ශාඛාව ලංකා බැංකුව - ප්‍රධාන ශාඛාව

සභාපතිගේ පණිවිඩය

ජාතික විදුලිබල පද්ධතියට අඛණ්ඩ ගල් අඟුරු සැපයුම සහතික කිරීම සඳහා 2008 දී ලංකා ගල් අඟුරු සමාගම ආරම්භ කරන ලද අතර, නොරොච්චෝලේ ලක්විජය බලාගාරය මෙගාවොට් 900 ක ප්‍රාථමික ප්‍රභවය ලෙස සේවය කරයි. මෙගාවොට් 300 ක මුළු ධාරිතාවයකින් යුත් බලාගාර තුනක් මෙයට ඇතුළත් වේ. එබැවින්, ජාතික ආර්ථිකයට මෙන්ම ජනතාවගේ දෛනික ජීවිතයට සැලකිය යුතු බලපෑමක් ඇති කරන, අවශ්‍ය ගල් අඟුරු ප්‍රමාණය කාලෝචිත ලෙස සැපයීම පවත්වා ගැනීම විශාල වගකීමකි.

2023 න් අවසන් වන වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව අපි සතුටට පත්වෙමු. ලංකා ගල් අඟුරු සමාගමේ සභාපති ලෙස මම 2020 වර්ෂයේ පෙබරවාරි සිට කටයුතු කරමි. එතැන් සිට මේ දක්වා, ගරු අමාත්‍යතුමාගේ, රාජ්‍ය අමාත්‍යවරුන්ගේ සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ මග පෙන්වීම යටතේ, දැඩි ආර්ථික අර්බුදය, විදේශ මුදල් හිඟය සහ සැපයුම්කරුවන්ගේ සීමාවන් ඇතුළු වසර පුරා මුහුණ දුන් අභියෝග රාශියක් මධ්‍යයේ වුවද, නොරොච්චෝලේ ලක්විජය බලාගාරයේ වාර්ෂික ගල් අඟුරු අවශ්‍යතාවය සපුරාලීමට ලංකා ගල් අඟුරු සමාගමට හැකි වී ඇති බව මම සතුටින් අවධාරණය කරමි.

පසුගිය වසරේ ලංකා ගල් අඟුරු සමාගමේ සභාපතිවරයා ලෙස, ගරු අමාත්‍යතුමාට, ගරු රාජ්‍ය අමාත්‍යවරුන්ට, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ පළපුරුදු සහෘදයන්ට ඔවුන්ගේ අගනා උපදෙස්, මග පෙන්වීම සහ සහයෝගය වෙනුවෙන් ඔවුන්ගේ කැපවීම අපගේ සාර්ථකත්වයට ඉවහල් වී ඇත. සාර්ථක සමයක් සම්පූර්ණ කිරීමට සහ මෙම ඉලක්ක විවිධාකාරයෙන් සාක්ෂාත් කර ගැනීමට මා හට සහාය වූ ලංකා විදුලබල මණ්ඩල සභාපති සහ කළමනාකාරිත්වය, බැංකුකරුවන්, සමාගම් ලේකම්වරුන් සහ විගණකවරුන් මාගේ කෘතඥතාවය පලකිරීමට මෙය අවස්ථාවක් කරගනිමි.

සභාපති

සංයුක්ත පාලනය

"සංයුක්ත පාලනය" යනු අයිතිවාසිකම් හා වගකීම් යටත් වන නීති, ක්‍රියාවලි හෝ රෙගුලාසිවලට අනුව ඒවා විවිධ සංස්ථාපිත ආයතන අතර බෙදාහරිනු ලබන ක්‍රම විස්තර කරන සාමාන්‍ය පදයකි. භාවිතයේදී, සංයුක්ත පාලනය යනු හිමිකරුවන් සෘජුව හෝ වක්‍රව තීරණ ගැනීමේ පද්ධතිය සහ සමාගම පාලනය කරන ව්‍යුහය අර්ථ දක්වනු ලැබේ. ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ සියලුම ක්‍රියාකාරකම්වල ව්‍යාපාරික අවංකභාවය සහ වෘත්තීය දක්ෂතාවය සුරක්ෂිත කිරීම වෙනුවෙන් එහි අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටී. මෙම කැපවීමේ කොටසක් ලෙස, විනිවිදභාවය, පාලනය සහ වගවීම අවධාරණය කරන පොදුවේ පිළිගත් ප්‍රතිපත්ති වැඩරාමුවක් පදනම් කරගෙන සමාගම තුළ යහ පාලන පරිචයන් පූර්වක්‍රියාකාරීව උද්යෝගීමත් කිරීමට එහි අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇත.

කොටස්කරුවන්, රජය සහ විය මෙහෙයවන සමාජය වෙනුවෙන් තමන්ගේ වගකීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත්ව සිටින අතර සමාගමේ ව්‍යාපාරික කටයුතු සිදුකරගෙන යාමේදී ආචාරධර්මීය පවැත්මක් ඉසිලීමට ඉතා පැහැදිළිව කැපවී සිටී. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට හා අමාත්‍යාංශයේ අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අවශ්‍යතාවය වේ.

ලංකා ගල්අඟුරු සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂවරුන් පත්කිරීම	අධ්‍යක්ෂවරුන්ගේ නම්
ගරු අමාත්‍යතුමා විසින් පත් කරන සභාපති ඇතුළුව අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු	(1) සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ (2)අධ්‍යක්ෂක
විදුලිබල මණ්ඩලය විසින් පත් කරන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු	(1)සාමාන්‍යාධිකාරී – අධ්‍යක්ෂක (2)ඒ.ජී.එම්. (ජනනය) – අධ්‍යක්ෂක
භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව විසින් පත් කරන එක් අධ්‍යක්ෂවරයෙකු	(1) අධ්‍යක්ෂක
ලංකා නැව් සංස්ථාවෙන් පත් කරන එක් අධ්‍යක්ෂවරයෙකු	(1) අධ්‍යක්ෂක (සාමන්‍යාධිකාරී)
වරාය අධිකාරියෙන් පත් කරන එක් අධ්‍යක්ෂවරයෙකු	(1) අධ්‍යක්ෂක
එකතුව	අධ්‍යක්ෂ මණ්ඩලය 7
විදුලිබල අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද නිරීක්ෂකයෙක්	අතිරේක ලේකම් -විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය

අධ්‍යක්ෂ මණ්ඩලයේ වර්තමාන සංයුතිය

2023 දෙසැම්බර් 31 දිනට නිලතල දැරූ සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම්

- **ගරු අමාත්‍යතුමා විසින් පත් කරන ලද සභාපති/ කළමනාකාර අධ්‍යක්ෂක**
  එස් .එන්. සුමනසේකර මහතා
  2022/10/06 දින සිට
- **ලංකා විදුලිබල මණ්ඩලය නියෝජනය කරන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්**
  ජී. ඒ. ඩී. ආර්. පී. සෙනෙවිරත්න මහතා
  2022/12/19 සිට
  ඩී. එන්. නවරත්න මහතා 2023/01/10 සිට
- **ලංකා නැව් සංස්ථාව නියෝජනය කරන අධ්‍යක්ෂක**
  ඩබ්ලිව්. එස්. වීරමන් මහතා 2021/08/01 සිට
- **වරාය අධිකාරිය නියෝජනය කරන අධ්‍යක්ෂක**
  කපිතාන් කේ. එම්. එන්. පී. සිල්වා
  2022/09/02 සිට
- **මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂක**
  අයි.ජේ. අබේරත්න මිය
  2023/02/08 සිට
- **ගරු අමාත්‍යතුමා විසින් පත් කරන ලද අධ්‍යක්ෂක**
  ඒ. ඩී. ජී. චාමික මහතා 2022/01/21 සිට

වර්ෂය තුළදී සමාගම සමග කිසිඳු සෘජු හෝ වක්‍ර ගිවිසුමකට එළඹීමට අධ්‍යක්ෂ මණ්ඩලයට ඇල්මක් නොතිබුණි. එකී කාලපරිච්ඡේදය සඳහා සමාගමේ

සංයුක්ත පාලනය

කටයුතුවල තත්ත්වය පිළිබඳව සත්‍ය හා සාධාරණ අදහසක් ලබාදෙන එකිනෙක මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ප්‍රකාරව පිළියෙල කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අවශ්‍යතාවය වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඒ සඳහා යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන ඒවා ස්ථාවරව සහ සාධාරණව අදාල කරගෙන ඇති අතර දූරදර්ශී විනිශ්චයන් සහ ඇස්තමේන්තු සිදුකර ඇත. අදාල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඇති අතර ඒවා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල විස්තර කර ඇත.

සෑමවිටම සමාගමේ වත්කම් ආරක්ෂා කිරීමට යුක්තිසහගත ක්‍රියාමාර්ග ගනු ලබන බවට සහතික කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගකිවය යුතු ය. මෙම සංදර්භය තුළ, වංචා සහ අනිකුත් අක්‍රමිකතා වැළැක්වීම සහ සොයා ගැනීම පිණිස ඔවුන් විසින් යෝග්‍ය අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපනය කර ඇත.

ගිණුම් පිළියෙල කිරීමේදී අඛණ්ඩභාවය යොදා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කර ඇත. සමාගමේ අයවැය සහ ණය ගැනීමේ පහසුකම් සමාලෝචනය කිරීමෙන් පසුව සිය මෙහෙයුම් අඛණ්ඩව සිදුකරගෙන යාම පිණිස ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව තිබෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වේ.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වන ලද දිනයන්

01. 2023.01.18
02. 2023.02.27
03. 2023.04.28
04. 2023.05.31
05. 2023.08.08
06. 2023.09.14
07. 2023.10.26
08. 2023.12.07
09. 2023.12.21

මූල්‍ය සහ මෙහෙයුම් යන විගණනයන් දෙකටම පසුව නිකුත් කරනු ලබන විගණකාධිපතිගේ වාර්තාවේ අභිතකර සටහන් අන්තර්ගතව තිබුණිග අපි මෙහෙයුම් පිළිබඳව ගතහොත්ල ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියල සැපයුම්කරුවන් සඳහා සිදුකරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් කිසිඳු උනන්දුවක් නොමැති කළමනාකරණ පාලනයල තත්ත්ව පාලනරැතත්ත්ව මිල ගැලපීම්ල විනිවිදභාවය සම්බන්ධයෙන් ප්‍රශ්න කරමින් අසාර්ථක ලංසුකරුවන් විසින් නිතර නිතර ගනු ලබන නෛතික ක්‍රියාමාර්ග ආදිය සඳහා සමාගමට වැඩි වශයෙන් කටයුතු කිරීමට සිදුව තිබූ ගැටළු යග මෙම කරුණුවලින් බොහෝමයක් විගණන වාර්තාවල ඉස්මතු කර පෙන්වා තිබුණිග කෙසේ වෙතත් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය විශාල ප්‍රමාණයකට විනිවිදභාවයෙන් සිදුකර ඇති බවට අපි සතුටින් සඳහන් කරන අතර කාලපරිච්ඡේදය සඳහා තරඟකාරී ලංසුකරුවන් අතර ප්‍රසම්පාදන ප්‍රදානය කිරීමට අදාලව විවාදශීලී ගැටළු නොතිබුණිග තවදුරටත්ල සියලුම විගණන වාර්තාවලට අප විසින් ක්ෂණිකව ප්‍රතිචාර දක්වා ඇති අතර ඒවායේ අන්තර්ගත අඩුලුහඩුකම් නිවැරදි කිරීමට ලබාදී තිබූ නිර්දේශ ක්‍රියාත්මක කළෙමුග ඒ අනුව මේ වනවිට අප වෙත නොලැබුණු විගණන වාර්තා නොමැති බවට ස්ථිරව සඳහන් කරමු.

අනුකූලවීම පාලනයේ වැදගත් ලක්ෂණයකි. ව්‍යවස්ථා සමග අනුකූලවීම සහතික කිරීම පිණිස කළමණාකරනය විසින් විශේෂ අවධානය යොමුකර ඇත. ඒ අනුව ආදායම් බදු, වැට් බදු වැනි බදු, සේ.අ.අ., සේ.නි.භා.අ. සඳහා ගෙවීම් සියල්ල සමාගම විසින් ගෙවා ඇති අතර වර්ෂය සඳහා විධිමත්ව සම්පූර්ණ කරන ලද වාර්තා සපයා ඇතග අතීත හිඟව පවතින අදායම් බදු පියවීම පිණිස දේශීය අදායම් දෙපාර්තමේන්තුව සමඟ මේ වන විට සාකච්ඡා කරමින් සිටිමු.

විගණන සහ කළමනාකරණ කමිටු (AMC)

විගණන සහ කළමනාකරණ කමිටුවේ වර්තමාන සංයුතිය

LCCහි අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරන සභාපති
අයි. පේ. අබේරත්න මෙනවිය (මහා භාණ්ඩාගාරය)

LCC හි අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරන සාමාජික
ඩබ්ලිව්. එස්. වීරමන් මහතා (ලංකා නැව් සංස්ථාව)

LCC හි අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරන සාමාජික
ජී. ඒ. ඩී. ආර්. පී. සෙනෙවිරත්න මහතා
(ලංකා විදුලිබල මණ්ඩලය)

සංයුක්ත පාලනය

රේඛීය අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු (AMC) රැස්වීමට සමාගම ක්‍රියාකාරීව සහභාගී වේ. අපි විගණන වාර්තාවට ප්‍රතිචාර දක්වා ඇති අතර, හැකිතාක් ප්‍රායෝගික ලෙස නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.

විගණන සහ කළමනාකරණ කමිටු (AMC) රැස්වීම් පවත්වන ලද දිනයන්

1) 2023.02.23
2) 2023.08.03
3) 2023.11.15

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණිත මූල්‍ය ප්‍රකාශන සමග වාර්ෂික වාර්තාව එහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සතුටින් ඉදිරිපත් කරමු.

සමාගමේ කටයුතු සම්බන්ධයෙන් මෙම වාර්ෂික වාර්තාවේ 2007 අංක 07 දරණ සමාගම් පනතේ 168 වෙනි වගන්තිය ප්‍රකාරව අවශ්‍ය කරනු ලබන තොරතුරු සහ සමහර අමතර තොරතුරු අන්තර්ගත වේ.

පොදු තොරතුරු

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමයනු සීමිත වගකීම් සහිත සමාගමක් වන අතර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2008 ජනවාරි 23 වන දින සමාගම් ලියාපදිංචි අංකය ලෙස PV 62636 සමග පුද්ගලික සමාගමක් ලෙස සංස්ථාගත කරන ලදී.

සමාගමේ සහ පරිපාලිත සමාගම්වල මූලික ක්‍රියාකාරකම් සහ වර්ෂය තුළ කාර්යසාධන සමාලෝචනය

වර්ෂය තුළ නොවෙනස්ව පවතින සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ ලංකා විදුලිබල මණ්ඩලයට අයත් (ලං.වි.ම.) නොරොච්චෝලෙයි හි පිහිටි ලක්විජය ගල්අඟුරු බලාගාරය සඳහා ප්‍රමිතිගත ගල්අඟුරු ආනයනය කොට සැපයීමේ ව්‍යාපාරයයි. ප්‍රමිතිගත ගල්අඟුරු යනුවෙන් අදහස් කරන්නේ, ආනයනය කොට සපයනු ලබන ගල්අඟුරු ගැනුම්කරු (ලං.වි.ම.) විසින් නියම කරනු ලබන විශේෂිත තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූල ගල්අඟුරු වීමය.

මූල්‍ය ප්‍රකාශන

සමාගමේ සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් Messrs එස් එන් සුමනසේකර මහතා සහ අයි. පේ. අබේරත්න මිය පිළිවෙලින් සභාපති සහ අධ්‍යක්ෂක විසින් නිසි පරිදි අත්සන් කර ඇත.

විගණකාධිපතිගේ වාර්තාව

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග අමුණා ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

සමාගමේ මූල්‍ය ප්‍රකාශන SLFRS/LKAS වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කොට ඇති අතර එහිදී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 3 හි පිටු අංක 47 සිට 54 යටතේ සඳහන් කර ඇත.

ප්‍රකාශිත ප්‍රාග්ධනය

2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය 2,000,000 ක සාමාන්‍ය කොටස් නියෝජනය කරමින් රු 20,000,000 ක් විය.

කොටස් හිමියන්ගේ තොරතුරු

2023 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ කොටස් හිමියන්ගේ තත්ත්වය පහත පරිදි වේ.

කොටස් හිමියන්	කොටස් හිමිකම%
ලංකා විදුලිබල මණ්ඩලය	60%
භාණ්ඩාගාර ලේකම්	20%
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	10%
සීමාසහිත ලංකා නැව් සංස්ථාව	10%

අධ්‍යක්ෂකවරුන්

2023 ජනවාරි 1 සිට දෙසැම්බර් 31 දක්වා සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ වෙනස්කම් පහත දැක්වේ.

- **ඒ. ආර්. නවමනී මහතා**
  (2023.01.10 දක්වා)
- **එස් ඩබ්ලිව් මදනායක මහතා**
  (2023.02.28 දක්වා)

අධ්‍යක්ෂක මණ්ඩලයේ වර්තමාන සංයුතිය

මණ්ඩලය අධ්‍යක්ෂක	පත් වීමේ දිනය
එස් එන් සුමනසේකර මහතා **සභාපති**	2022.10.06
ජී ඒ ඩී ආර් පී සෙනෙවිරත්න මහතා	2022.12.19
ඩී එන් නවරත්න මහතා	2023.01.10
ඩබ්ලිව් එස් වීරමන් මහතා	2021.08.01

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව

ඒ ඩී ජී චාමික මහතා	2022.01.21
කපිතාන් කේ එම් එන් පී සිල්වා	2022.08.04
අයි පේ අබේරත්න මිය	2023.02.28

වර්ෂය තුළ සමාගම සමග කිසිඳු ගිවිසුමකට සෘජුව හෝ වක්‍රව එළඹීමට අධ්‍යක්ෂකවරුන්ට ඇල්මක් නොතිබුණි. සමාලෝචිත ගිණුම් කාලපරිච්ඡේදය තුළ සමාගම සමග පැවැති සම්බන්ධිත පාර්ශව ගනුදෙනු මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 28 පිටු අංක 67 හි දක්වා ඇත.

අධ්‍යක්ෂකවරුන්ගේ පාරිශ්‍රමික

අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික මූල්‍ය ප්‍රකාශන සඳහා සටහනේ 28.2 හෙලිදරව් කර ඇත.

පරිත්‍යාග

සමාලෝචිත වර්ෂය තුළ සමාගම විසින් කිසිඳු පරිත්‍යාග යක් සිදුකර නොමැත.

දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ සංචලනවලට අදාල තොරතුරු මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් අංක 10 හි දක්වා ඇත.

සංචිත

2023 දෙසැම්බර් 31 දිනට සමාගම සතු සංචිතවල වටිනාකම රු.මි. 119.5 ක් ලෙසට ගණන් බලා ඇත. එහි සංචලනය මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්වල පිටු අංක 42 හි දක්වා ඇත.

සේවානියුක්තිය

2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ සේවානියුක්තිය පුද්ගලයින් 23 ක් විය.

බැඳීම් සහ අසම්භාව්‍යතා

2023 දෙසැම්බර් 31 දිනට බැඳීම් සහ අසම්භාව්‍යතා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 25 හි දක්වා ඇත.

විගණකවරුන්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සහ 20 වැනි සංශෝධන අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය ප්‍රකාරව , සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන විගණනය විගණකාධිපති විසින් සිදු කරන ලදී.

විගණකවරුන් සහ බදු උපදේශක

සමාගම	විගණකගේ/බදු උපදේශක	ගෙවීම් වර්ගය	වටිනාකම රු.
සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම	විගණකාධිපති	විගණන ගාස්තු	නිම කිරීමට ඇත.

විගණකවරයාට හැර සමාගම සම්බන්ධයෙන් විගණකවරුන්ට කිසිදු ඇල්මක් නොමැත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි සංශෝධනයේ 154 වැනි ව්‍යවස්ථාවට අනුකූලව ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා විගණකවරයා ලෙස විගණකාධිපතිවරයා පත් කරනු ඇත.

මෙම වාර්ෂික වාර්තාවට අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සභාපති සහ අධ්‍යක්ෂකවරුයෙකු විසින් අත්සන් තබනු ලැබේ.

සභාපති **අධ්‍යක්ෂක**

ශිරෝමි බාලසූරිය (LLB කොළඹ)
ලේකම්වරු

අවදානම් කළමනාකරණය

1) වෙළඳපොල අවදානම

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම ගල්අඟුරු මිල සම්බන්ධ වෙළඳපොළ අවදානමට නිරාවරණය වේ. කෙසේ වෙතත් මෙම නිරාවරණය විවෘත අවදානමක් ලෙසත් එය අඩුවන නිරාවරණයක් ලෙසත් අපි අර්ථ දක්වමු. පළමුවෙන්ම සියලුම ප්‍රසම්පාදන ක්ෂණික සහ දීර්ඝකාලීන යන දෙකම (both spot and term) තරඟකාරී ලංසු තැබීම පදනම් කරගෙන සත්‍ය ලෙසින්ම අනුකූල වූ අඩුම මිල ගණන් ඉදිරිපත් කරනු ලැබූ ලංසුකරු වෙත ප්‍රදානය කරනු ලැබේ.

තරඟකාරී ලංසු තැබීම ආරම්භ වන්නේ ඉල්ලුම සහ සැපයුම මගින් දක්වනු ලබන තරඟකාරී මිල ගණන් ඉදිරිපත් කිරීමෙනි. ක්ෂණික ප්‍රසම්පාදනවලදී (Spot Tender) මිල ගණන් ඉදිරිපත් කරනු ලබන ප්‍රසම්පාදන යටතේ සියලුම සැපයුම් සඳහා ප්‍රදානය කිරීමේ මිල ස්ථාවරව පවතී. දීර්ඝකාලීන ප්‍රසම්පාදනවලදී (Term Tender) ප්‍රදානය කරන මාසය සහ නෞහාර බිල්පත් මාසය අතර ආගස් ගල්අඟුරු මිල දර්ශකය (Argus Coal Price Index) මගින් චලනය වන නිසා සැපයුම් මිල නම්‍ය කරනු ලබයි. ඉහත කරුණු හැර, ප්‍රසම්පාදන පිරිවිතරවලට අනුව මිල/ තත්ත්ව අනුකූලතාව සහතික කිරීම පිණිස තත්ත්ව මිල ගැලපීම හඳුන්වා දෙනු ලැබේ. එබැවින් ගල්අඟුරු මිල සම්බන්ධයෙන් සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමට තිබෙන අවදානම අඩුවන නිරාවරණයක් වේ

2) ණය අවදානම

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ එකම මිලදී ගන්නා වන්නේ ලංකා විදුලිබල මණ්ඩලය වන බැවින් එය ණය අවදානමට නිරාවරණය වන්නේ නැත. කෙසේ වෙතත් සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම වර්තමානයේ ණය අයකර ගැනීම සම්බන්ධ නෛතික කටයුතු සහ ව්‍යාපාර-ව්‍යාපාර කතිකා කරගැනීම සම්බන්ධයෙන් මුළුමනින්ම යොමුවී ඇත. ණය අයකර ගැනීමේ ප්‍රයත්නයන් අතර ප්‍රධාන වශයෙන පහත සඳහන් ණය දැක්විය හැකි අතර එය මේ වන විට දීර්ඝ නීතිමය කටයුත්තක්, බේරුම්කරණයක් සහ කතිකා කරගැනීමක් බවට පත්ව ඇත.

2.1 සී/ස ලංකා නැව් සංස්ථාව (CSC)

සී/ස ලංකා නැව් සංස්ථාව (CSC) රු. 589,973,845

ඉහත මුදල ඉන්දියාවේ Taurian Iron and Steel Company Ltd සමාගම වෙත ගල්අඟුරු සැපයීම වෙනුවෙන් 2012 වර්ෂයේ සිට හිගව පවතින අතර එකී සැපයුම සඳහා ලංකා නැව් සංස්ථාවට අනුව ඉහත සඳහන් මුදල අයකර ගැනීම සම්බන්ධයෙන් පැන නැගී ඇති ආරවුල විසඳීමේ කාර්යය භාණ්ඩාගාරය, ලංකා නැව් සංස්ථාව, ලං.වි.ම. සහ සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම යන ආයතනවලින් එක් සාමාජිකයෙකු බැගින් සාමාජිකයින් 4 දෙනෙකුගෙන් යුත් කමිටුවක් විසින් හසුරුවන ලදි. කමිටුවේ වාර්තාව අමාත්‍ය මණ්ඩල ආර්ථික කළමනාකරණ කමිටුව වෙත යොමු කරන ලද අතර ඊට ප්‍රතිචාරය අපේක්ෂාවෙන් සිටිමු.

2.2 Liberty Commodities Ltd.

Liberty Commodities Ltd., රු. 236,785,640 (එක්සත් ජනපද ඩොලර් 1,575,633)

සත්‍ය වශයෙන්ම අනුකූල වූ අඩුව මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරු ලෙස Liberty Commodities Ltd ආයතනය වෙත පළමු ක්ෂණික ප්‍රසම්පාදනය 2015 -16 දී ප්‍රදානය කරනු ලැබීය. කෙසේ වෙතත්, තත්ත්ව ගැලපීමේ සූත්‍රය මෙහෙයවීමෙන් සහ ප්‍රසාද දීමනා ඉල්ලමින් Liberty Commodities Ltd ආයතනය විසින් ණයවර ලිපිය මත එහි දැක්වෙන මුදලට වඩා වැඩි මුදලක් ලබාගෙන ඇති බවට සොයා ගනු ලැබීය. Liberty Commodities Ltd ආයතනය විසින් වැඩියෙන් ලබාගෙන ඇති මුදල අයකර ගැනීම පිණිස සමාගම විසින් multi-prong ක්‍රියාවන් ආරම්භ කර ඇත. මෙම කටයුතුවලට පහත සඳහන් දෑ ඇතුළත් වේ.

I. වැඩියෙන් ලබාගෙන ඇති මුදල අයකර ගැනීම පිණිස සමාගම විසින් බස්නාහිර පළාත් වාණිජ මහාධිකරණයේ නඩුවක් ගොනුකර ඇත.

II. මෙම කරුණ සම්බන්ධයෙන් වාණිජ මහාධිකරණයේ උපදෙස් මත සමාන්තර බේරුම්කරණ පටිපාටියක් පවතී.

III. සමාගම වෙත එක්සත් ජනපද ඩොලර් 1,000,000 ක මුදලක් ගෙවන ලෙස නිකුත් කරන ලද අතුරු බේරුම්කරණ ප්‍රදානයට එරෙහිව Liberty Commodities Ltd ආයතනය විසින් අභියාචනයක් ගොනුකර ඇත.

අවදානම් කළමනාකරණය

IV. තවද, Liberty Commodities Ltd ආයතනය විසින් නිකුත් කරන ලද කාර්යසාධන ඇපකරය කැඳවන ලෙස සමාගම විසින් ඉල්ලුම් කර ඇත.කෙසේ වෙතත්, Liberty Commodities Ltd ආයතනය විසින් සමාගමට එරෙහිව ජිනීවා හි සිවිල් නඩුවක් ගොනුකර ඇත. අපගේ නඩුවට ජිනීවාහිදී පෙනී සිටීම පිණිස නීතිපති දෙපාර්තමේන්තුව හරහා නීතිඥවරුන් අප විසින් නම් කරන ලදි. කෙසේ වෙතත් කාර්යසාධන ඇපකරය, ගල්අඟුරු සැපයීමේදී සිදුවන අඩුපාඩුකම් වෙනුවෙන් පමණක් සීමා වන නිසාත් ඇණවුම් කරන ලද ප්‍රමාණය නිසි පරිදි භාරදුන් බවත්, භාරගත් බවත් සමාගම විසින් ලිඛිතව තහවුරු කළ නිසාත් අධිකරණය විසින් Liberty Commodities Ltd ආයතනයට පක්ෂව තීන්දුව ලබාදෙන ලදි.

කාර්යසාධන සමාලෝචනය

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ ප්‍රධාන කාර්යයන් වන්නේ ආසන්න වශයෙන් මෙට්‍රික් ටොන් මිලියන 2.25 ක් වන වාර්ෂික ගල්අඟුරු අවශ්‍යතාවය නොරොච්චොලෙයි හි පිහිටි ලක්විජය ගල්අඟුරු බලාගාරය සඳහා ප්‍රසම්පාදනය කොට ලංකා විදුලිබල මණ්ඩලයට සැපයීමය. ගල්අඟුරු මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ සිට ප්‍රසම්පාදන කැඳවීම සහ නිම කිරීම, ප්‍රසම්පාදනය කිරීම සහ ලක්විජය ග්ලඅඟුරු බලාගාරයේ ජැටිය දක්වා ගල්අඟුරු ප්‍රවාහනය යන සියලුම ක්‍රියාකාරකම් වෙනුවෙන් සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම වගකීමෙන් බැඳී සිටී. සෑම වසරකම සැප්තැම්බර් සිට ඊළඟ වර්ෂයේ අප්‍රේල් මාසය දක්වා පුත්තලම වෙරළ නිරිතදිග මෝසම් සුළඟින් තදබල ලෙස බලපෑමට ලක්වන නිසා ඉහතින් සඳහන් කළ ගල්අඟුරු ප්‍රමාණය දින 210 ක් වැනි සීමිත කාලපරිච්ඡේදයක් තුළ සැපයිය යුතුය. එබැවින්, ගල්අඟුරු ප්‍රවාහනය කිරීම් මාස 5 ක කාලයක් අත්හිටුවන බවට අපේක්ෂා කෙරේ.

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ මෙහෙවර වන්නේ ලක්විජය ගල්අඟුරු බලාගාරය මඟින් විදුලිබලය උත්පාදනය කිරීම පිණිස ඉහළ ප්‍රමිතියකින් යුත් ගලඅඟුරු නියම මිලට සැපයීම, ගල්අඟුරු දහනයේදී විමෝචනය වන ද්‍රව්‍ය කළමනාකරණය කිරීම, ඒවා පරිසර හිතකාමී නව්‍ය නිෂ්පාදන බවට පරිවර්තනය කිරීම සහ එකී නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වාදීම, තාප බලශක්ති ප්‍රභවයක් ලෙස ගල්අඟුරු පෞද්ගලික අංශය සඳහා ප්‍රවර්ධනය කිරීම, කර්මාන්තකරුවන් වඩා ශක්තිමත් කිරීම සහ එමඟින් රටේ සංවර්ධනයට දායකවීම වේ.

සීමාසහිත ලංකා ගල් අඟුරු සමාගම (පුද්ගලික) සමාගම සිය සංස්ථාපිත මුල් වසරවලදී ලංකා විදුලිබල මණ්ඩලයට ගල් අඟුරු සැපයීම මත මෙට්‍රික් පදනම් වූ මිල අනුව අය කිරීම සිදු කරන ලදි. එබැවින් සමාග මේ කාර්ය සාධනය මැනිය හැකි විය. 2014 සිට ලංකා විදුලිබල මණ්ඩල මිලකරණ ව්‍යුහය වෙනස් කළ අතර සීමාසහිත ලංකා ගල් අඟුරු සමාගම (පුද්ගලික) සමාගම සමාගමට ශුද්ධ පොදු කාර්ය පිරිවැයට සමාන ගාස්තුවක් පිරිනමන ලදී. ලංකා ගල් අඟුරු සමාගම විසින් උපයන සැපයුම්කරුවන්ගේ ලියාපදිංචි ගාස්තු, පොලිය වැනි අනෙකුත් ආදායම්වල ශුද්ධ පොදු කාර්ය පිරිවැය ලෙස ශුද්ධ පොදු කාර්ය අර්ථ දක්වා ඇත. ශුද්ධ පොදු කාර්ය පාදක ගාස්තුව ක්‍රියාත්මක කිරීමත් සමඟ වාණිජ අවධානය හඹා යෑම වෙනුවට අවම පිරිවැය ප්‍රතිස්ථාපනය විය. මූලාශ්‍රකරණයේ ප්‍රශස්ථ පිරිවැය සහතික කිරීම සඳහා ඇතැම් මිනුම් ලකුණු එතැන් සිට භාවිතයේ පවතී.

ප්‍රධාන ක්‍රියාකාරකම්

ජාතික විදුලිබල පද්ධතියේ ප්‍රාථමික බලශක්ති ප්‍රභවය ලෙස LVPP දෛනික විදුලි ජනනයෙන් 40% සිට 50% දක්වා දායක වේ. මාස 7ක ගල් අඟුරු සැපයුම සීමා වීම හේතුවෙන් අප්‍රේල් අග සිට සැප්තැම්බර් අග දක්වා පුත්තලම නැංගුරම් පොළට ගොඩබෑමක් සිදු නොවේ. භාණ්ඩාගාරය විසින් පත් කරන ලද ඔෑක සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද SSCAPC සහ SCAPC අමාත්‍ය මණ්ඩල අනුමැතියට යටත්ව සියලුම ක්ෂණික සහ දීර්ඝකාලීන ප්‍රසම්පාදන නිර්දේශ කර අනුමත කරනු ලැබේ.

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම විසින් ඉටුකරනු ලබන ක්‍රියාකාරකම් පහත දැක්වෙන ශීර්ෂ යටතේ පුළුල් ලෙස වර්ග කළ හැකිය.

I. සැපයුම්කරුවන් ලියාදිංචි කිරීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ ප්‍රදානය කිරීම.

II. ණයවර ලිපි විවෘත කිරීම, බැංකුකරුවන් සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම, බැංකු පහසුකම් විධිමත් කිරීම භාණ්ඩාගාර ඇපකර සහ ලේඛන පවත්වා ගැනීම.

III. ප්‍රසම්පාදනය, ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව, ගල්අඟුරු පැටවූ ස්ථානයේ සිට ජැටිය දක්වා මාරු කිරීම සඳහා ගැල්කුලී සහ බත්තල් සේවා.

IV. ගැනුම්කරු (ලක්විජය ගල්අඟුරු බලාගාරය), සැපයුම්කරුවන්, පර්යන්ත මෙහෙයුම්කරුවන්, ශ්‍රී ලංකා රේගුව, රක්ෂණ, නාවික හමුදාව, ලංකා නැව් සංස්ථාව ආදිය සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම සහ පාර්ශවකරුවන් අතර විවිධ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම.

V. සපයන ලද ප්‍රමාණය සත්‍යාපනය කිරීමෙන් පසුව සහ තත්ත්ව ගැලපීමේ සූත්‍රය අදාල කරගනිමින් ඉන්වොයිසියේ වට්නාකම්න් 80% ක් සහ 20% ක් නිදහස් කිරීම පිණිස භාරගැනීමේ සහ තහවුරු කිරීමේ ලිපි නිකුත් කිරීම.

කාර්යසාධන සමාලෝචනය

ගල්අඟුරු ප්‍රසම්පාදනය කිරීමේ ක්‍රියාවලිය

ආරම්භක ගල්අඟුරු 2015.07.23 සහ 2015.10.14 දින අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය පරිදි දීර්ඝකාලීන ප්‍රසම්පාදන (Term Tenders) ඔස්සේ ප්‍රසම්පාදනය කරනු ලබන අතර ගල්අඟුරු ප්‍රසම්පාදන ක්‍රම දෙකක් වනම් දීර්ඝකාලීන සහ කෙටිකාලීන (ක්ෂණික) ප්‍රසම්පාදන යටතේ සිදුකිරීමට අනුමැතිය ලබාදෙන ලදි. තෝරාගත් ගල්අඟුරු සැපයුම්කරුවන් විසින් ලබාදී ඇති ගැල්කුලී අනුපාත සංසන්දනය කිරීම පදනම් කරගෙන ගල්අඟුරු පටවනු ලබන වරායේ සිට ඒවා නිදහස් කිරීමට නැංගුරම් ලා සිටින වරාය දක්වා ප්‍රවාහනය කිරීම ලංකා නැව් සංස්ථාව (CSC) විසින් මෙහෙයවනු ලබයි.

ගල්අඟුරු බත්තල් මගින් පුත්තලම නැංගුරම්පළේ සිට ලක්විජය බලාගාරයේ ජැටිය දක්වා ගල්අඟුරු ප්‍රවාහනය ලංකා නැව් සංස්ථාව මගින් සිදුකරනු ලබන අතර ඔවුන්ගේ බත්තල් සේවා සැපයුම්කරු විසින් මෙහෙයුම් කටයුතු සිදුකරනු ඇත.

ගල්අඟුරු ප්‍රසම්පාදන ක්‍රියාවලිය

LCC ලංසු ලේඛන කෙටුම්පත සකස් කර එවා සමාලෝචනය සහ සංශෝධන සඳහා TEC වෙත යොමු කරයි

TEC අවසාන ලංසු ලේඛනය SSCAPC/SCAPC වෙත නිර්දේශ කරයි

ලංසු කැඳවීමට SSCAPC/SCAPC විසින් ලංසු ලේඛනය අනුමත කර විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය හාරහා LCC වෙත දැනුම් දෙනු ලබයි

සියලුම ලියාපදිංචි සැපයුම්කරුවන් සඳහා LCC විසින් ක්ෂණික/දිගුකාලීන ලංසු කැඳවයි

SSCAPC/SCAPC විසින් පත් කරන ලද ලංසු විවෘත කිරීමේ කමිටුව විසින් ටෙන්ඩර් විවෘත කර LCC සභාපති වෙත භාර දෙනු ලබයි

LCC හි සභාපති ඒවා TEC සභාපති වෙත භාර දෙනු ලබන අතර TEC ඇගයීමට ලක් කර SSCAPC/SCAPC වෙත නිර්දේශ කරනු ලබයි

SSCAPC විසින් ප්‍රතිචාර දක්වන ලද අඩුම ලංසුකරු තෝරාගැනීම සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කරයි

දීර්ඝකාලීන ප්‍රසම්පාදන ප්‍රදානය කරනු ලබන්නේ කැබිනට් අනුමැතියෙන් පසුව වන අතර කැබිනට් අනුමැතියට පෙර ක්ෂණික ප්‍රසම්පාදන ප්‍රදානය කර පසුව කැබිනට් අනුමැතිය ආවරණය කරනු ලබයි

අමාත්‍යාංශයෙන් (MOP&E) පිරිනැමීමේ තීරණය ලැබීමෙන් පසු, තෝරාගත් ලංසුකරුට LCC විසින් පිරිනැමීම දැනුම් දීම

කාර්යසාධන සමාලෝචනය

ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ බලයලත් සාමාජිකයන්

LVPP හි වාර්ෂික ගල් අඟුරු අවශ්‍යතාවයට අනුව, සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම ගල්අඟුරු ප්‍රසම්පාදන සඳහා ප්‍රසම්පාදන කමිටු පත් කරන ලෙස අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කරයි. ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව සහ විශේෂ ස්ථාවර කැබිනට් මණ්ඩලය විසින් ප්‍රසම්පාදන කමිටුවක් පත් කරන ලදී. (SSCAPC) මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය අංශය විසින් පත් කරනු ලැබේ.

තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) සහ විශේෂ ස්ථාවර කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව (SSCAPC) මත පදනම් වූ කැබිනට් අනුමැතියේ නිර්දේශයට අනුව සියලුම ගල් අඟුරු නැව්ගත කිරීම් බලාගාරයට සපයා ඇත.


තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) සහ ස්ථාවර කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවේ (SCAPS) සංයෝජනය පහත පරිදි වේ,

දීර්ඝකාලීන ප්‍රසම්පාදන සඳහා SCAPC සහ TEC සාමාජිකයන්	
SCAPC	TEC
ලේකම් - විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය (සභාපති)	AGM - ජනන/ලංවිම (සභාපති)
ලේකම් - විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය	PPM - LVPP, ලංවිම
ලේකම් - සූර්යබල, සුළං සහ ජලවිදුලි ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	අධ්‍යක්ෂක - MOP
අතිරේක ලේකම් - ERD, මුදල් අමාත්‍යාංශය	AFM (ජනන) -ලංවිම
සාමාන්‍යාධිකාරී, ලංවිම	අධ්‍යක්ෂක - රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව
	සාමාන්‍යාධිකාරී - LCC
	අතිරේක සාමාන්‍යාධිකාරී - CSC
	මූල්‍ය කළමණාකරු - LCC
	සිවිල් ඉංජිනේරු - පරිසර, ලංවිම
	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - DOME/මොරටුව විශ්වවිද්‍යාලය

ක්ෂණික ප්‍රසම්පාදන සඳහා SSCAPC සහ TEC සාමාජිකයන්	
SSCAPC	TEC
ලේකම් - කම්කරු අමාත්‍යාංශය (සභාපති)	AGM - ජනන/ලංවිම (සභාපති)
ලේකම් - විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය	PPM - LVPP, ලංවිම
නියෝජ්‍ය අධිපති - ශ්‍රී ලංකා මහ බැංකුව	අධ්‍යක්ෂක - TT,T&D/MOP
අතිරේක ලේකම් - මුදල් අමාත්‍යාංශය	AFM භාණ්ඩාගාරය / ලංවිම
සාමාන්‍යාධිකාරී, ලංවිම	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව
	සාමාන්‍යාධිකාරී - LCC
	අතිරේක සාමාන්‍යාධිකාරී - CSC
	කළමණාකරු - CPC
	සිවිල් ඉංජිනේරු - TDE, ලංවිම
	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - DOME/මොරටුව විශ්වවිද්‍යාලය

කාර්යසාධන සමාලෝචනය

ගල් අඟුරු මෙහෙයුම්



FOB = **Free On Board** – Coal Cost at Loading Port

CFR = **Cost and Freight – Coal Cost and Freight Up to the Puttalam Anchorage**

ඉදිරි ගල් අඟුරු වාර සැලැස්ම 2024/2025

- පළමු නැව ගොඩබෑමේ වරායට පැමිණීම - 2024.09.10
- 2025 අප්‍රේල් මැද සියලුම නැව්ගත කිරීම් ගොඩබෑමට සැලසුම් කරමින්
- නැව්ගත කිරීමක් ගොඩබෑමේ සාමාන්‍ය දින - දින 3.5 සිට 4 දක්වා
- ඒ අනුව මාසයකදී ගොඩබෑමට හැකි යාත්‍රා සංඛ්‍යාව - 6 හෝ 7
- මුළු නැව්ගත කිරීම් = නැව්ගත කිරීම් 38

සටහන: උපකල්පන


1. සියලුම ගෙවීම් නියමිත වේලාවට සිදු කෙරේ
2. නියමිත ETA මත යාත්‍රාව පැමිණේ (+/- දින 2)
3. අවම කාලගුණ ප්‍රමාදයන්
4. නැව් ක්‍රියාකාරිත්වයේ ස්වභාවය හේතුවෙන් දින කිහිපයක් ප්‍රමාද වීම සිදුවිය හැක

කාර්යසාධන සමාලෝචනය

පසුගිය කාර්ය සාධන

ඉල්ලුම තෘප්තිමත් කිරීම

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම පසුගිය වසර පහ තුළ LVPP හි ඉල්ලුම තෘප්තිමත් කර ඇති බව පහත ප්‍රස්තාරික නිරූපණයෙන් පැහැදිලි වේ.



2023-2024 වාර සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ ගල් අඟුරු අවශ්‍යතාවය 2.42MMT +/-10% කි.

ප්‍රසම්පාදන අංකය	සැපයුම්කරු	නැවගත කිරීම් ගණන	සැපයූ ප්‍රමාණයේ එකතුව (මෙ.ටො.)
LCC/22/PROP/1	කොරල් එනර්ජි	4	236,297
LCC/23-24/ST/30/01	කොරල් එනර්ජි	5	293,998
LCC/22/PROP/1	බ්ලැක් සැන්ඩ්	16	914,459
LCC/22/PROP/1	පොටෙන්සියා එල්එල්සී	13	775,817
එකතුව (මෙ.ටො)		**38**	**2,220,571**

2022-2023 වාරය සඳහා නැව් සංඛ්‍යාව 30 දක්වා අඩු කිරීමට කරුණු කිහිපයක් මත පදනම් වූ විචක්ෂණශීලි තීරණයක් බව පෙනේ.

2022 - 2023 වාරය සඳහා නැව් සංඛ්‍යාව 30 දක්වා අඩු කිරීමට හේතු

1. **ප්‍රසම්පාදන අවලංගු කිරීම**. සැලකිය යුතු ගල් අඟුරු ප්‍රමාණයක් සඳහා ප්‍රසම්පාදන අවලංගු කිරීම (උදා. මෙ.ටොන් මිලියන 4.5, මෙ.ටොන් මිලියන 2.25, මෙ.ටොන් 300,000) ඉල්ලුම අඩුවීමක් යෝජනා කරයි, ඒ අනුව නැව් සංඛ්‍යාව අඩු කිරීම තර්කානුකූලව කරයි.
2. **පීටී ඇරිස්ටා මිට්රි ජායා විසින් කාර්ය සාධනයක් නොකිරීම.** පීටී ඇරිස්ටා මිට්රි ජායා විසින් ක්‍රියා නොකිරීම හේතුවෙන් පිරිනැමූ ප්‍රසම්පාදන අවලංගු කිරීම සහ පසුව Coral Energy සහ Combast Industry වෙත පිරිනැමීම හේතුවෙන් බාධා කිරීම් සහ මගහැරුණු ගිහියන්ට සිදු විය. නැව් සංඛ්‍යාව අඩු කිරීම පවතින සම්පත් වඩා හොඳින් කළමනාකරණය කිරීමට උපකාරී වේ.

කාර්යසාධන සමාලෝචනය

3. **නැව් වාර කාලසටහන් සහ ප්‍රමාද වූ සැපයුම් පිළිබඳ ගැටළු,** යාත්‍රා නාමයෝජනා තහවුරු කිරීමේ ප්‍රමාදයන්, Black Sand/Suek AG විසින් ප්‍රමාද වූ සැපයුම සහ සමස්ත කාලසටහන් බාධා කිරීම් හේතුවෙන්, සංශෝධිත කාලසීමාවන්ට ගැළපෙන පරිදි නැව් සංඛ්‍යාව ප්‍රශස්ත කිරීමේ අවශ්‍යතාවය පෙන්නුම් කරයි.

4. **ස්විස් සිංගප්පූරුව සහ බ්ලැක් සෑන්ඩ් සමඟ ගෙවීම් ගැටළු,** ස්විස් සිංගප්පූරුව සහ බ්ලැක් සෑන්ඩ් විසින් අත්තිකාරම් ගෙවීම් සඳහා වන ඉල්ලීම්, ප්‍රමාද වූ ගෙවීම් සමග මුල් කාලසටහනට බාධා ඇති වී තිබේ. නැව් සංඛ්‍යාව අඩු කිරීම ගෙවීම් නියමයන් සහ කාලසටහන් සමග වඩා හොඳින් පෙළගැස්වීමට උපකාරී වේ.

5. **ලංකා නැව් සංස්ථාවේ** (CSC) **මෙහෙයුම් ප්‍රමාදයන්.** ලංකා නැව් සංස්ථාවෙහි කාලය ගතවන නැව් නාමයෝජනා තහවුරු කිරීමේ ක්‍රියාවලිය සහ මූල්‍ය කරුණු සහ වැරදි සන්නිවේදනයන් හේතුවෙන් පසුගිය මෙහෙයුම් අත්හිටුවීම් යෝජනා කර අඩු කරන ලද නැව් සංඛ්‍යාව මෙහෙයුම් කාර්යක්ෂමතාව කළමනාකරණය කිරීමට උපකාරී වන බවයි.


6. **ලංකා විදුලිබල මණ්ඩලයේ** (CEB) **ගල් අඟුරු ප්‍රමාණය පිළිබඳ අවිනිශ්චිතතාවය,** LVPP වෙතින් නවතම ගල් අඟුරු ප්‍රමාණය ඉල්ලීම තහවුරු කිරීමේ ප්‍රමාදය සහ පසුගිය වාරයේ ප්‍රමාද වූ ගෙවීම් සම්බන්ධ ගැටලුවලින් පෙන්නුම් කරන්නේ නැව් නාමයෝජනා කිරීමේදී ප්‍රවේශම් විය යුතු බවයි. නැව් සංඛ්‍යාව අඩු කිරීම අවිනිශ්චිතතාවයන් කළමනාකරණය කිරීමේදී වඩා හොඳ නම්‍යශීලී බවක් ලබා දෙයි.

7. **ලංකා විදුලිබල මණ්ඩලය මත මූල්‍ය බලපෑම,** අතපසු වූ නැව් වාර කාලසටහන් සහ ප්‍රමාද වූ ගෙවීම් හේතුවෙන් අනවශ්‍ය වියදම්, විනිමය පාඩු සහ ප්‍රමාදය වැනි මූල්‍යමය බලපෑම, වඩා හොඳ මූල්‍ය සහ මෙහෙයුම් කළමනාකරණය සඳහා නැව් සංඛ්‍යාව අඩු කිරීමේ තීරණයට තවදුරටත් සහාය වේ.

සාරාංශයක් ලෙස, ගෙනහැර දක්වන ලද හේතු ගල් අඟුරු සැපයුම් දාමයේ සංකීර්ණ අභියෝග සහ අවිනිශ්චිතතාවයන් වෙත යොමු කරයි. නැව් සංඛ්‍යාව අඩු කිරීමෙන් මෙම ගැටලු අවම කර ගැනීමටත්, සම්පත් වෙන් කිරීම ප්‍රශස්ත කිරීමටත්, 2022-2023 වාරය සඳහා සමස්ත මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමටත් හැකි වේ. බලාගාරයට ඉල්ලූමට සරිලන සැපයුමක් නොලැබුණත් LCC ආයතනයෙන් ලබාදුන් ගල් අඟුරු මගින් කිසිදු බාධාවකින් තොරව මුළු අවුරුද්දටම විදුලිය නිපදවීමට හැකි විය.

රක්ෂණ අනුපාත

2016 - 2017 වාරයේ රක්ෂණ ගාස්තු US /0.05/MT වූ අතර එය 2017/2018 දී US / 0.048/MT සහ 2021/2022 US/ 0.008 සහ 2022/23 වාරයේ දී ද US/ 0.008 දක්වා අඩු කරන ලදී. රටෙහි පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ගල් අඟුරු මිලෙහිද මෙය කැපී පෙනෙන අගයක් වන අතර සියලූ මිල ගණන් ඉහළ ගොස් ඇති අතර රක්ෂණ ගාස්තුවලට සමානව පසුගිය වසරේ මිල ගණන් යටතේම පවත්වාගෙන යනු ඇත.



කාර්යසාධන සමාලෝචනය

සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සහ නැවත ලියාපදිංචි කිරීම

සැපයුම්කරු නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය විධිමත් කර ඇත. ඒ අනුව, සෑම වසරකම ආරම්භයේදී ජාතික පුවත්පත්වල දැන්වීමක් පළ කර විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා සියලුම ශ්‍රී ලාංකික විදේශ දූත මණ්ඩල දැනුවත් කරයි. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් සෑම සතියකම සඳුදා විවෘත කෙරෙන අතර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අයදුම්පත් ඇගයීමට ලක් කර ඔවුන්ගේ නිර්දේශ කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබේ. ඉහත ඔෑක සහ SSCAPC අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පසුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් පත් කරනු ලැබේ. ඒ අනුව SSCAPC අදාළ සැපයුම්කරුගේ අනුමැතියෙන් පසු LCC යටතේ ලියාපදිංචි ගල් අඟුරු සැපයුම්කරුවෙකු ලෙස ඇමෙරිකානු ඩොලර් 5,000ක් අයකර ලියාපදිංචි කරනු ලැබේ.

අනාගත උපායමාර්ගික සැලැස්ම

අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ මගපෙන්වීම මත සමාගම පහත කරුණු කෙරෙහි අවධානය යොමු කර තිබේ.

- **LCC ක්‍රමවත් කිරීම සඳහා SORP, අභ්‍යන්තර පාලන ක්‍රියා පටිපාටි අත්පොත සහ අනෙකුත් ක්‍රියාපටිපාටි සකස් කිරීම**

  සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම ආරම්භයේ සිටම සුදුසු SORP නොතිබුණි. එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට අනුව සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමෙහි SORP සකස් කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාමාර්ගයක් පවතින අතර දැනට සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය බඤ විසින් සකස් කරන ලද SORP කෙටුම්පත සමාලෝචනය කිරීම සඳහා සාමාජිකයින් පස් දෙනෙකුගෙන් (ලංවිමෙන් දෙදෙනෙකු, CSCයෙන් එක් අයෙකු, අමාත්‍යාංශයෙන් එක් අයෙකු සහ සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමෙන් එක් අයකුගෙන්) සමන්විත කමිටුවක් පත් කිරීමට තීරණය කර තිබේ.

- **පෞද්ගලික අංශයට ගල් අඟුරු සැපයීම**

  ශ්‍රී ලංකාවේ උදුන්/බොයිලේරු සඳහා තාප ගල් අඟුරු භාවිත කරන කර්මාන්තකරුවන් ස්වල්ප දෙනෙක් සිටිති. ඔවුන්ට ඉතා කුඩා ප්‍රමාණ අවශ්‍ය වන අතර පිරිවිතර වෙනස් විය හේ. ඒ නිසා සියලුම කර්මාන්තකරුවන් තෘප්තිමත් කිරීමට එක ගල් අඟුරු තොගයක් ගෙන වීම අපහසුය. කෙසේ වෙතත්, සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම කුඩා ගල් අඟුරු තොගයක් මුලින් ගෙන වීම සඳහා ඔවුන් සමඟ සාකච්ඡා කරමින් සිටී.

- **තරඟකාරිත්වය වැඩි කිරීම සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව පුළුල් කිරීමේ පදනම**

  මේ සඳහා දැනටමත් කටයුතු සිදුවෙමින් පවතින අතර මේ වන විට සැපයුම්කරුවන් 26 දෙනෙකු ලියාපදිංචි කර ඇති අතර දැනට 17 ක් ක්‍රියාත්මක වේ. එසේම, 2020 වසර අවසානයේ සිට, තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය මත ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ඇතිව, ජාත්‍යන්තර ක්‍රියාපටිපාටිය අනුව සෑම වසරකම අදාළ තානාපති කාර්යාල හරහා පුළුල් ප්‍රචාරයක් සිදුකිරීමටත්, සෑම වසරකම සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය විධිමත් කිරීමටත්, තෙවසරක යෝග්‍යතා පරීක්ෂණයකින් පසු නැවත ලියාපදිංචි වීමටත් කටයුතු සම්පාදනය කෙරේ.

- **මිලදී ගැනීමේ මිලෙහි අතරමැදි පිරිවැය වළක්වා ගනිමින් ලංසු ඉදිරිපත් කරන ලෙස පතල් හිමියන්ට ආරාධනා කිරීම**

  ගල් අඟුරු පතල්කරුවන්ටද අපගේ ප්‍රසම්පාදන සඳහා සෘජුවම ලංසු ඉදිරිපත් කළ හැකි ආකාරයට ප්‍රසම්පාදනය සිදු කෙරේ. ප්‍රධාන ගල් අඟුරු පතල් කම්කරුවෙකු වන Glen core ද දැනට සැපයුම්කරුවෙකු ලෙස ලියාපදිංචි වී ඇත. රාජ්‍ය තාන්ත්‍රික සබඳතා උපයෝගී කර ගනිමින් දෙරට අතර සෘජු ගල් අඟුරු (රාජ්‍යන් අතර) මිලදී ගෙන රටට පහසුකම් සැලසීමට අමාත්‍යාංශය අවශ්‍ය පියවර ගනිමින් සිටී.

- **ගල් අඟුරු දහනයෙන් විමෝචනය වීමේ බලපෑම්වලට එරෙහිව "හරිත ආර්ථිකය" ප්‍රවර්ධනය කිරීම**

- **ගල් අඟුරු දහන ක්‍රියාවලියේ අතුරු නිෂ්පාදන ලෙස කාබන්ඩයොක්සයිඩ්, ඔක්සිජන් වැනි නව නිෂ්පාදන නිස්සාරණය කිරීම**

- **මාස හයක මෝසම් කාලයෙන් ඉකුත් පිටවී "දින 365 බෙදාහැරීම් යථාර්ථයක් බවට පත් කිරීමට නොපසුබස්නා උත්සාහය**

අනාගත උපායමාර්ගික සැලැස්ම

මේ සඳහා විකල්ප යෝජනා කිහිපයක් ඉදිරිපත් වී ඇති අතර අමාත්‍යාංශයේ සහ විදුලිබල මණ්ඩලයේ මගපෙන්වීම ඇතිව ඒකාබද්ධව කටයුතු කරමින් පවතී.

- පවතින ජැටිය පුත්තලම නැංගුරම් පොළ දක්වා දීර්ඝ කිරීම (කිලෝමීටර් 4)
- LCC යාත්‍රා ප්‍රමාණය 60,000±10%MT සිට 65,000±10% MT දක්වා වැඩි කිරීමට සැලසුම් කිරීම
- ජැටිය දෙපස ගොඩබෑමේ පහසුකම
- ගියර් රහිත විශාල යාත්‍රා භාවිතා කර ප්‍රතිනැව්ගත කිරීම් භාවිතයෙන් බෑම
- නැංගුරම දක්වා ජැටිය දිගු කිරීම
- ත්‍රිකුණාමලයේ සිට ගල් අඟුරු ප්‍රවාහනය ත්‍රිකුණාමලයේ සිට මහව දක්වා දුම්රිය මාර්ගය ලක් විජය බලාගාරය දක්වා දීර්ඝ කිරීම.

- **ප්‍රසම්පාදන සැලැස්ම සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම**

  සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම ආරම්භයේ සිටම ඉහත සැලසුම් 2 නිසි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත. ඉහත සැලසුම් දෙක සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව එය විධිමත් කර ඇති අතර ඒවා විධිමත් අනුමත ක්‍රියා පටිපාටි සඳහා අමාත්‍යාංශය වෙත යොමු කර තිබේ.

- **ලංවිම මගින් පිරිවැය ප්‍රතිපූරණය කිරීම වෙනුවට LCC ලාභ ලබන ආයතනයක් බවට පත් කිරීම.**

- **රාජ්‍ය තාන්ත්‍රික මැදිහත්වීම හරහා ලංකා ගල් අඟුරු සමාගමට (LCC) දිගුකාලීන ගල් අඟුරු සැපයීමේ හැකියාව ගවේෂණය කිරීම. මේ වන විට එම ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර දකුණු අප්‍රිකාව, බ්‍රසීලය, පෝලන්තය සහ රුසියාව යන රටවලින් යෝජනා හතරක් ලැබී ඇත. අමාත්‍යාංශ ලේකම්වරයාගේ මඟපෙන්වීම යටතේ පත්කළ කමිටුව යෝජනා ඇගයීමට ලක් කරනු ලැබේ.**



මූල්‍ය වාර්තා
2023

ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශනය

2023 දෙසැම්බර් 31 දිනට

	සටහන්	2023 රු.	2022 රු.
ආදායම	4	161,408,218,035	117,406,287,221
සෘජු වියදම් (විකුණුම් පිරිවැය)	5	(161,333,588,954)	(117,337,279,052)
දළ ලාභය		74,629,080	69,008,169
ලියාපදිංචි සහ වෙනත් ආදායම්	6	19,004,116	8,221,503
පරිපාලන වියදම්		(74,286,749)	(78,525,284)
මෙහෙයුම්වලින් ලද ලාභය		19,346,447	(1,295,612)
මූල්‍ය ආදායම්	7	8,996,047	1,360,766
මූල්‍ය පිරිවැය		(28,342,495)	(65,154)
බදු පෙර ලාභය	8	-	-
ආදායම් බදු වියදම්	9	-	-
වර්ෂය සඳහා ලාභය		-	-
අනෙකුත් විස්තීර්ණ ආදායම්		-	-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්		-	-

සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩ කොටසක් සාදයි.
වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩුකිරීම් දක්වයි

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනට

	සටහන්	2023 රු.	2022 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	10	4,047,718	5,351,133
අනෙකුත් ජංගම නොවන වත්කම්	11	826,759,484	826,759,484
		830,807,203	**832,110,617**
ජංගම වත්කම්			
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	12	32,636,221,678	7,867,474,749
සැපයුම්කරුවන්ට ගෙවන ලද අත්තිකාරම්		3,783,443,652	9,533,023,217
ආපසු ගෙවන තැන්පතු	13	715,310	117,000
මූල්‍ය වත්කම්	14	64,653,478	20,981,068
කාර්යමණ්ඩල සඳහා ණය	15	3,808,680	1,858,734
ලැබිය යුතු බදු	16	29,266,966	29,266,966
බැංකුවේ තිබෙන මුදල් සහ අතැති මුදල්	17	5,249,313,355	45,301,997
		41,767,423,119	**17,498,023,730**
මුළු වත්කම්		**42,598,230,321**	**18,330,134,347**
ප්‍රකාශිත ප්‍රාග්ධනය	18	20,000,000	20,000,000
රඳවාගත් ඉපැයුම්		91,629,879	91,629,879
ප්‍රත්‍යාගණන සංචිත		7,875,000	7,875,000
		119,504,879	**119,504,879**
ජංගම නොවන වගකීම්			
නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්	19	9,545,510	8,078,510
අනෙකුත් ජංගම නොවන වගකීම්	20	714,965,434	714,965,434
		724,510,944	723,043,944
ජංගම වගකීම්			
ණයහිමියන් සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	21	25,587,540,839	17,481,415,520
පොලී සහිත ණය සහ ණය ගැනීම්	22	16,156,103,254	*
උපචිත වියදම්	23	6,485,406	4,269,346
ගෙවිය යුතු ආදායම් බදු	24	4,084,998	1,900,659
		41,754,214,498	17,487,585,524
මුළු වගකීම්		**42,478,725,442**	**18,210,629,468**
මුළු හිමිකම් සහ වගකීම්		**42,598,230,321**	**18,330,134,347**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 7 දරන සමාගම් පනතේ අවශ්‍යතාවලට අනුකූලව සකස් කර ඇති බව මම සහතික කරමි.

බී.ඒ.ඒ.කුමාර
මුල්‍ය කළමණාකරු

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරනු ලැබේ. අධ්‍යක්ෂමණ්ඩලය වෙනුවෙන් අනුමත කර අත්සන් කරමු.

අධ්‍යක්ෂකගේ නම	සභාපති/අධ්‍යක්ෂ	අත්සන
ෂෙහාන් චින් සුමනසේකර	සභාපති	
	අධ්‍යක්ෂ	

2024 පෙබරවාරි 27
කොළඹ

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනට

	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.	රඳවාගත් ඉපැයුම් රු.	ප්‍රත්‍යාගණන සංචිත රු.	එකතුව රු.
2021.01.01 දිනට ශේෂය	20,000,000	79,094,282	7,875,000	106,969,282
2021 වර්ෂය සඳහා ලාභය	-	-	-	-
අනෙකුත් විස්තීර්ණ ආදායම්	-	-	-	-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්	-	-	-	-
2021.12.31 දිනට ශේෂය	20,000,000	79,094,282	7,875,000	106,969,282
2022 වර්ෂය සඳහා ලාභය	-	-	-	-
අනෙකුත් විස්තීර්ණ ආදායම්	-	-	-	-
පෙර වර්ෂයේ ගැලපීම්	-	12,535,597	-	12,535,597
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්	-	12,535,597	-	12,535,597
2022.12.31 දිනට ශේෂය	20,000,000	91,629,879	7,875,000	119,504,879
2023 වර්ෂය සඳහා ලාභය	-	-	-	-
අනෙකුත් විස්තීර්ණ ආදායම්	-	-	-	-
පෙර වර්ෂයේ ගැලපීම්	-	-	-	-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්	-	-	-	-
2023.12.31 දිනට ශේෂය	**20,000,000**	**91,629,879**	**7,875,000**	**119,504,879**

ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් සාදයි
වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යාවලින් අඩුකිරීම් දක්වයි

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනට

	2023 රු.	2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් (භාවිත)/මුදල් ගැලීම		
ආදායම් බදු වියදම්වලට පෙර ශුද්ධ ලාභය	-	-
ගැලපීම්,		
ක්ෂයවීම්	2,713,713	2,844,726
ක්ෂයවීම් සඳහා ගැලපීම	2,700	*
පාරිතෝෂික ප්‍රතිපාදන	1,467,000	2,559,190
මූල්‍ය ආදායම්	(8,996,047)	(1,360,766)
මූල්‍ය පිරිවැය	28,342,495	65,154
අනෙකුත් ආදායම්	(8,500)	(29,260)
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභය	**23,521,361**	**4,079,044**
කාරක ප්‍රාග්ධන වෙනස්කම්,		
වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම	(24,768,746,930)	1,997,905,413
සැපයුම්කරුවන්ට ගෙවන ලද අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම කිරීම	5,749,579,565	(9,533,023,217)
තැන්පතු (වැඩිවීම)/ අඩුවීම	(598,310)	-
කාර්ය මණ්ඩල ණය වැඩිවීම/(අඩුවීම)	(1,949,946)	998,334
ණය හිමියන් වැඩිවීම/(අඩුවීම)	8,106,125,320	7,527,047,030
පොලී සහිත ණය සහ ණය ගැනීම් (වැඩිවීම)/අඩුවීම	16,156,103,254	-
උපචිත වියදම් වැඩිවීම/(අඩු වීම).	2,216,061	1,428,632
මෙහෙයුම් වලින්/ (භාවිතයෙන්) මුදල් උත්පාදනය	**5,266,250,373**	**(1,564,765)**
අඩුකළා :		
මූල්‍ය වියදම් ගෙවීම්	(28,342,495)	(65,154)
පෙර වර්ෂයේ ගැලපීම්	-	12,535,597
පාරිතෝෂිත ගෙවීම්	-	-
ආදායම් බදු ගෙවීම්	(393,736)	(5,217,787)
ආදායම් බදු ගැලපීම	2,578,076	498,665
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින්/(භාවිතයෙන්) ශුද්ධ මුදල් උත්පාදනය	**5,240,092,218**	**6,186,556**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහ		
දේපල, පිරියත සහ උපකරණ අත්පත් කරගැනීම්	(1,412,999)	(571,688)
අනෙකුත් ආදායම්	8,500	29,260
පොලී ආදායම්	8,996,047	1,360,766
ආයෝජන ක්‍රියාකාරකම් වලින්/(භාවිතයෙන්) ශුද්ධ මුදල් උත්පාදනය	**7,591,549**	**818,338**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	5,247,683,767	7,004,894
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ	66,283,065	59,278,171
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ	**5,313,966,832**	**66,283,065**
මුදල් සහ මුදල් සමාන දෑ විශ්ලේෂණය		
බැංකුවේ තිබෙන මුදල් - වාසිදායක	5,249,313,355	45,301,997
අතැති මුදල්	-	-
බැංකුවේ සහ අතැති මුදල්	5,249,313,355	45,301,997
කෙටි කාලීන ආයෝජන	64,653,478	20,981,068
	5,313,966,832	**66,283,065**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යවශ්‍ය කොටසක් වේ.
වරහන් තුළ දක්වා ඇති සංඛ්‍යා මගින් අඩුකිරීම් පෙන්නුම් කරයි.

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1. වාර්තා කරනු ලබන අස්ථිත්වය

1.1 ස්ථාපනය සහ නෛතික ආකෘතිය

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2008 ජනවාරි මස 01 වෙනි දින සංස්ථාපනය කරන ලද සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය පරිශ්‍රය අංක 51/3, දුටුගැමුණු මාවත, දෙහිවල යන ස්ථානයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වන්නේ නොරොච්චෝලෙයි හි පිහිටි ලක්විජය ගල්අඟුරු බලාගාරය වෙත (LVPP) කාලසීමාව තුළ සම්පාදනය කිරීම ය. ලංකා ගල්අඟුරු සමාගම (LCC) මෙම බැඳීම සිය පැවැත්ම පුරාවට උද්යෝගීමත්ව සපුරාලමින් සිටී. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේ සිට ලක්විජය ගල්අඟුරු බලාගාරයේ ජැටිය (Jetty) දක්වා ගල්අඟුරු ලබාදීම දක්වා වන සියලුම ක්‍රියාකාරකම් සිදුකරනු ලබයි. ලංකා ගල්අඟුරු සමාගම මගින් ඉටුකරනු ලබන ක්‍රියාකාරකම් පහත දැක්වෙන ශීර්ෂ යටතේ පුළුල්ව වර්ග කළ හැකිය:-

1. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම, ප්‍රසම්පාදන පිරිසැකසුම් කිරීම සහ ප්‍රදානය කිරීම.
2. ණයවර ලිපි විවෘත කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුව, ආනයන සහ අපනයන දෙපාර්තමේන්තුව සහ බැංකුකරුවන් සමඟ සම්බන්ධතා පැවැත්වීම සහ බැංකු පහසුකම් සහ ලිපි ලේඛන විධිමත් කිරීම.
3. ප්‍රවර්ධන, ප්‍රවාහනය සහ බත්තල් සේවා.
4. ගැනුම්කරු (LVPP) සැපයුම්කරුවන්, පර්යන්ත ක්‍රියාකරුවන්, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා නාවික හමුදාව, ලංකා නැව් සංස්ථාව ආදිය සමඟ සම්බන්ධතා පැවැත්වීම සහ පාර්ශවකරුවන් අතර විවිධ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය.

වර්ෂය අවසානය වනවිට සමාගමේ සාමාන්‍ය සේවක සංඛ්‍යාව 23 ක් විය.

1.3 මව් ව්‍යවසාය සහ අත්‍යන්ත මව් ව්‍යවසාය

සමාගම සියයට 100 ක්ම රජයට අයත් අස්ථිත්වයක් වන අතර මූලික මව් කළමනාකරණ සහ පාලන පාර්ශවය වන්නේ සමාගම සංස්ථාපනය කිරීමේ සිට එහි කොටස්වලින් 60% අයත් ලංකා විදුලිබල මණ්ඩලය ය. ලංකා විදුලිබල මණ්ඩලය සංස්ථාපනය කරන ලද්දේ 1969 අංක 17 දරණ ලංකා විදුලිබල මණ්ඩල පනත යටතේය.

1.4 අධ්‍යක්ෂකවරුන් විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2024 පෙබරවාරි 27 වැනි දින නිකුත් කිරීමට බලය ලබා දී ඇත.

පිටු අංක 45 සිට 71 දක්වා මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලවීමේ ප්‍රකාශනය

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ලාභ හෝ අලාභ ප්‍රකාශනය සහ අනිකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය යන අංගවලින් සමන්විත සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ ඒ සඳහා සටහන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නියම කොට ඇති ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට (SLFRSs සහ LKASs) සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූලව පිළියෙල කොට ඇති අතර අවශ්‍ය පරිදි යෝග්‍ය අනාවරණය කිරීම් සපයා ඇත.

වර්ෂය තුළ අනුගමනය කරන ලද සුවිශේෂී ගිණුම් පිළිවෙත් අංක 3.1 සිට 3.14 දක්වා

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

සටහන්වල දක්වා ඇත. අදාල SLFRSs සහ LKASs www.casrilanka.com දරණ වෙබ් අඩවියෙන් ලබාගත හැකි ය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ එහි දක්වා ඇති අනාවරණය කිරීම් පෙර අනුගමනය කරන ලද ඉදිරිපත් කිරීම්වලට අනුකූල වේ. ආදායම් ප්‍රකාශනය, සටහන් අංක 3.8.1 හි විස්තර කර ඇති 2017 වර්ෂයෙන් ආරම්භවී උපයෝගී කරගනු ලැබූ ආදායම් හඳුනාගැනීමේ ප්‍රතිපත්තියෙන් සමන්විත වේ.

2.2 ඇගයීමේ පදනම

මූල්‍ය ප්‍රකාශය වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් උපචිත පදනම මත සහ වෛතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇත.

2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කරනු ලබන්නේ සමාගමේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ය. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට වටයා ඇත.

2.4 ප්‍රමාණාත්මකභාවය සහ සමුච්චිත කිරීම

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත LKAS 1 ට අනුකූලව (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම), සමාන අයිතමවල එක් එක් ද්‍රව්‍ය වර්ගය මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. සමාන නොවන ස්වභාවයේ අයිතම හෝ ක්‍රියාවන්ද වීවා ද්‍රව්‍යාත්මක නොවේ නම් මිසක වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් හිලව් කරනු ලබන අතර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශුද්ධ වටිනාකම වාර්තා කරනු ලබන්නේ හඳුනාගත් වටිනාකම් හිලව් කිරීමට නීති ප්‍රකාරව බලාත්මක අයිතියක් තිබෙන විට සහ ශුද්ධ පදනම මත හිලව් කිරීමට හෝ වත්කම උපලබ්ධි කිරීමට සහ ඒ සමඟම බැරකම හිලව් කිරීමට අපේක්ෂා කරන්නේ නම් පමණි.

ගිණුම් ප්‍රමිතියකින් අවශ්‍ය කරනු ලබන්නේ නම් හෝ අවසර දී ඇත්නම් මිසක ආදායම් සහ වියදම් නිශ්චය කිරීමේදී වීවා හිලව් කරනු නොලැබේ.

2.5 ගිණුම්කරණ ප්‍රතිපත්ති, වෙනස්කම් සහ සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් අදාල කරගනු ලැබූ ගිණුම් පිළිවෙත් වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති නම් මිසක පෙර වර්ෂයේ භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුරූප වේ. ආදායම සහ විකුණුම් පිරිවැය සඳහා ගිණුම් හැසිරීම 2017 වර්ෂයේදී ආරම්භ කරන ලද ප්‍රතිපත්තිය පරිදි ගැනුම්කරුවෙකුගේ සහ විකුණුම්කරුවෙකුගේ ආදායමට සහ විකුණුම් පිරිවැයට අනුකූල වේ. මෙම වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූල වීම පිණිස පෙර වර්ෂයේ සංඛ්‍යා සහ වාක්‍ය ඛණ්ඩ අවශ්‍ය අවස්ථාවලදී නැවත සකස් කර ඇත.

2.6 ඇස්තමේන්තු, විනිශ්චයන් සහ උපකල්පන භාවිතය

SLFRS/LKAS වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී කළමනාකරණයට ගිණුම්කරණ ප්‍රතිපත්ති යෙදීමට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සහ වාර්තා කරන ලද වත්කම්, බැරකම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන් සහ වාර්තා කරන දිනයේදී අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කිරීම අවශ්‍ය වේ. සැබෑ ප්‍රතිඵල එම ඇස්තමේන්තු සහ විනිශ්චය තීරණවලට වඩා වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ පෙන්වාදී තිබෙන උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ. සංශෝධනය බලපාන්නේ එම කාල සීමාවට පමණක් නම් හෝ සංශෝධන කාල සීමාව තුළ සහ වර්තමාන සහ අනාගත කාල පරිච්ඡේද දෙකටම සංශෝධනය බලපාන්නේ නම්, ගිණුම්කරණ ඇස්තමේන්තු වල සංශෝධන ඇස්තමේන්තු සංශෝධිත කාල සීමාව තුළ පිළිගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

2.7 . ශේෂ පත්‍ර දිනයෙන් පසුව සිදුවන සිදුවීම්

සියලුම ප්‍රමාණාත්මක ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම් සලකා බලා සුදුසු ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අදාළ සටහන් වල, එනම් මූල්‍ය ප්‍රකාශන සඳහා අංක 25 සටහනෙහි සිදු කර තිබේ.

2.8 ගිණුම් ඇස්තමේන්තුවල වෙනස්වීම්

ඇස්තමේන්තු වෙනස් කිරීම වත්කම්, වගකීම් හෝ හිමිකම්වල වෙනස්කම් ඇති කරන අවස්ථා හැර, බලපෑමට ලක් වූ කාල පරිච්ඡේදයේ (වෙනස් කිරීමේ කාල සීමාව සහ අනාගත කාල පරිච්ඡේදවල) ලාභයේ හෝ අලාභයේ බලපෑම් ඇතුළත් කිරීමෙන් අස්ථිත්වයේ අනාගත ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් හඳුනා ගනී. මෙම අවස්ථාවෙහිදී, වෙනස්වන කාලපරිච්ඡේදය තුළ අදාළ වත්කම්, වගකීම් හෝ හිමිකම්වල ධාරණ අගය ගැලපීමෙන් එය හඳුනා ගැනේ.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.1 වත්කම් සහ ඒවායේ තක්සේරු පදනම

ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් මුදල් සහ සමාගමේ ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළදී හෝ ශේෂ පත්‍ර දින සිට වසරක් ඇතුළත යන කාලපරිච්ඡේද දෙකෙන් වඩාත් කෙටි කාලයක් තුළ මුදල් වශයෙන් උපලබ්ධි කර ගැනීමට අපේක්ෂා කරන වත්කම් වේ. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් චිනම්, මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ දින සිට වසරක කාල සීමාවකින් ඔබ්බට සමාගම තබා ගැනීමට අදහස් කරන ඒවා වේ.

3.2 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ සඳහන් කරනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය කිරීම් සහ යම් සමුච්චිත අපහානයන අගය අඩු කිරීමෙන් ය. දේපළ, පිරියත සහ උපකරණයක පිරිවැය, එය මිළට ගැනීමට වැය කළ මුදල සහ එකී වත්කම භාවිතා කිරීමට අපේක්ෂා කරන තත්ත්වයට ගෙන ඒමට වැය කළ සෘජුවම ආදේශ කල හැකි යම් පිරිවැයකින් සමනවිත වේ.

ස්වයං - ඉදිකළ වත්කම්වල පිරිවැයට ද්‍රව්‍යවල පිරිවැය, සෘජු ශ්‍රමය, සහ වත්කම භාවිතා කිරීමට අපේක්ෂා කරන තත්ත්නයට ගෙන ඒමට වැය කළ සෘජුවම ආදේශ කළ හැකි යම් වෙනත් පිරිවැය ඇතුළත් වේ. මෙයට අයිතමය ගැලවීමට සහ ඉවත් කිරීමට සහ ඒවා ස්ථානගත කරනු ලබන වැඩබිමේදී ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී දැරීමට සිදුවූ පිරිවැයද ඇතුළත් වේ.

යම් හෙයකින් වත්කමක් ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස එහි ධාරණ අගය වැඩි වන්නේ නම් එකී වැඩිවීම එකී වත්කම සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණන සංචිතයේ පවත්නා යම් බැර ශේෂයක ප්‍රමාණයට ප්‍රත්‍යාගණන සංචිත ශීර්ෂය යටතේ සෘජුවම හිමිකම්වලට බැර කළ යුතුය. කෙසේ වෙතත්, එම වත්කම සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණනය කිරීමේ සංචිතයේ පවතින ඕනෑම බැර ශේෂයක ප්‍රමාණයට ප්‍රත්‍යාගණනය කිරීමේ සංචිතය යන ශීර්ෂය යටතේ අඩුවීම සෘජුවම හිමිකම්වලට හර කරනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගයන් ආපසු අයකර ගත නොහැකි සිදුවීම් හෝ තත්ත්වයන්ගේ වෙනස්කම් පෙන්වන විටෙකදී එකී ධාරණ අගයන් අපහායනය කිරීම සඳහා සමාලෝචනය කරනු ලැබේ.

3.2.1 පසුකාලීන පිරිවැය

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක කොටසක් ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පිරිවැය එකී අයිතමයේ ධාරණ අගයට හඳුනාගනු ලබන්නේ එකී කොටසින් මූර්තිමක් කරන අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒමට ඉඩ ඇතිවී නම් සහ එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් ය. ප්‍රතිෂ්ඨාපනය කරනු ලබන එකී කොටස්වල ධාරණ අගය හඳුනා නොගනු ලබන්නේ

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

පහත දක්වා ඇති හඳුනා නොගැනීමේ ප්‍රතිපත්තියට අනුකූලවය. දේපළ, පිරියත සහ උපකරණ අලුත්වැඩියා කිරීමේ වියදිනෙදා පිරිවැය හඳුනාගනු ලබන්නේ ඒවා දැරීමට සිදුවන පරිදි ලාභය හෝ අලාභ තුළ වේ.

දේපළ, පිරියත සහ උපකරණ වෙනස් ඵලදායි ආයු කාලයක් සහිත කොටස්වලින් සමන්විත විය හැකිය. ක්ෂය කිරීම ගණනය කරනු ලබන්නේ එක් එක් තනි කොටසේ ආයු කාලය පදනම් කරගෙනය. යම් හෙයකින් එක කොටසක් ප්‍රතිෂ්ඨාපනය කිරීමේදී වත්කමක් හඳුනා ගැනීමේ උපමානය සපුරාලන ප්‍රමාණයට අලුත් කොටස ප්‍රාග්ධනීකරණය කරනු ලබන අතර ප්‍රතිෂ්ඨාපනය කරනු ලබන කොටසේ ධාරණ අගය හඳුනාගනු නොලැබේ. අයිතමයේ ඵලදායි ආයු කාලය පුරා නියමිත කාල පරාසයන් තුළ සිදුවන ප්‍රධාන පරීක්ෂාවක හෝ ප්‍රතිසංස්කරණයක පිරිවැය එය වත්කමක හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන තරමට ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. ප්‍රතිෂ්ඨාපනය කරනු ලබන කොටසේ ධාරණ අගයන් හඳුනාගනු නොලැබේ.

3.2.2 හඳුනා නොගැනීම

හඳුනා නොගැනීම යනු මූල්‍ය වත්කමක් හෝ අස්ථිත්‍යයක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍ය බැරකම හඳුනා ගැනීම අවසන් කිරීම සඳහා භාවිතා කරන යෙදුම වේ. දේපළ, පිරියත හෝ උපකරණ අයිතම හඳුනා නොගනු ලබන්නේ ඒවා ප්‍රතිස්ථාපනය කිරීමේදී, අපහරණය කිරීමේදී හෝ ඒවා භාවිතා කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විටෙකදී වේ. වත්කමක් හඳුනා නොගැනීමේදී ලැබෙන යම් ආදායමක් හෝ සිදුවන අලාභයක් එකී වත්කම හඳුනා නොගනු ලබන වර්ෂයට අදාල ආදායම් ප්‍රකාශයේ ඇතුළත් කරනු ලැබේ.

3.2.3 ක්ෂය කිරීම

ක්ෂය කිරීම ගණනය කරනු ලබන්නේ දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක එක් එක් කොටසේ ඇස්තමේන්තුගත ඵලදායි ආයු කාලය මත සරල මාර්ග පදනම මත ය. මූල්‍ය කල්බදු යටතේ වන වත්කම් ක්ෂය කරනු ලබන්නේ කල්බදු කාලසීමාව සහ සමාන ස්ව*වත්කම්වල ඵලදායි ආයු කාලය යන දෙකින් වඩාත් කෙටි කාලය මත ය. සින්නක්කර ඉඩම් ක්ෂය කරනු නොලැබේ. කල්බදු වැඩිදියුණු කිරීම් යටතේ පවතින වත්කම් බදු කුලී ගිවිසුම පරිදි වසර 2 ක කාලයක් තුළ ක්ෂය කරනු ලැබේ.

වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය භාවිතයට ගත හැකි තත්ත්වයට පත්වන විට සහ එකී වත්කම දරන්නේ විකිණීමට හෝ හඳුනා නොගැනීමට යනුවෙන් වර්ගීකරණය කරනු ලබන දිනවලින් කලින් එළඹෙන දින නවතනු ලැබේ.

ක්ෂය කිරීම සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ සින්නක්කර ඉඩම් හැර ක්ෂය කරනු ලබන වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායි ආර්ථික ආයු කාලය මත ඒවායේ තක්සේරු වටිනාකම පොත්වලින් කපා ඉවත් කිරීම පිණිස සියලුම දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය හෝ තක්සේරු වටිනාකම මත සරල මාර්ග ක්‍රමයක් භාවිතා කරමිනි.

වත්කම්වල ඇස්තමේන්තුගත සඵල ආයු කාලය පහත පරිදි වේ.

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

වත්කම	සළුල ආයු කාලය වර්ෂ
ගෘහ භාණ්ඩ සහ සවිකුරු	5
උපකරණ	4
මෝටර් රථ	4
පරිගණක උපකරණ	4
ජාලකරණ පද්ධති	2
කල්බදු ඉඩම් වැඩිදියුණු කිරීම	2

එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ වත්කම්වල ඵලදායී ආයු කාලය සහ සුන්බුන් අගය සමාලෝචනය කර අවශ්‍ය නම් සකස් කරනු ලැබේ. 2020 දෙසැම්බර් 31 දිනැති ප්‍රත්‍යාගණනය කරන ලද මෝටර් රථවල ඵලදායී ආයු කාලය වසර 4ක් ලෙස ඇස්තමේන්තු කර තිබේ.

3.3 මූල්‍ය කල්බදු

මූල්‍ය කල්බදු මත දේපළ, පිරියත සහ උපකරණ කල්බදු අයිතමවල හිමිකාරිත්වයට අදාළ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස සමාගමට පැවරෙන, කල්බදු වත්කම් ලෙස වර්ගීකරණය කර දේපළ, පිරියත සහ උපකරණ යටතේ කල්බදු වත්කම් ලෙස වර්ග කරනු ලබන අතර සහ කල්බදු ආරම්භයේ දී ඒවායේ වටිනාකමට වඩා අඩු සහ අවම කල්බදු ගෙවීමේ වර්තමාන වටිනාකමට සමාන මුදලක්, සමුච්චිත ක්ෂයවීම් අඩුවෙන් දක්වනු ලැබේ. ක්ෂය කිරීම සිදුකරනු ලබන්නේ කල්බදු වත්කම භාවිතා කිරීමෙන් සමාගම අපේක්ෂා කරන ප්‍රතිලාභය ලැබෙන කාලපරිච්ඡේදය මත ය.

3.4 ණය ගැනීමේ පිරිවැය

ණය ගැනීමේ පිරිවැය හඳුනාගනු ලබන්නේ අත්පත් කරගැනීමට සෘජුවම ආදේශ කළ හැකි ණය ගැනීමේ පිරිවැය හැර වත්කමින් අපේක්ෂිත ප්‍රයෝජනය හෝ විකිණීම සඳහා සූදානම් වන සැලකිය යුතු කාලපරිච්ඡේදයක් ගන්නා එකී වත්කමේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලබන අවස්ථාවේදී යෝග්‍යතා වත්කමක් ඉදිකිරීමේදී හෝ නිෂ්පාදනය කිරීමේදී ඒවා වියදම් වූ කාලපරිච්ඡේදයේදී දැරීමට සිදුවූ වියදමක් වශයෙනි.

3.5 මූල්‍ය මෙවලම් - SLFRS 09

SLFRS - 09 මගින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකම් හඳුනා ගැනීමේ සහ මැනීම සඳහා අවශ්‍යතා නියම කරයි. IFRS 9 කලින් අදාල කරගැනීමට අවසර ඇත. සංසන්දනාත්මක තොරතුරු නැවත ලබා දීමෙන් උපකාරවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සංක්‍රාන්තික ප්‍රතිපාදනද සංශෝධනය කරන ලද අතර IFRS 9 වර්ගීකරණය සහ තක්සේරු ආදර්ශය වෙත ගමන් කිරීමේ බලපෑම අවබෝධ කරගැනීමට මූල්‍ය ප්‍රකාශන භාවිතා කරන්නන්ට සහායවීම සඳහා නව අනාවරණය කිරීම් හඳුන්වා දෙන ලදි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෘණ හානිපූරණ සහිත කලින් ගෙවීමේ විශේෂාංගවලට අදාලව සංශෝධනයක්ද ඇතුළත් කරන ලදි. මෙම සංශෝධන 2019 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන අතර, නිශ්චිත කොන්දේසියක් සපුරා ඇත්නම් - ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමක් වෙනුවට - ක්‍රමක්ෂය කළ පිරිවැයකින් හෝ වෙනත් විස්තීර්ණ ආදායමක් හරහා සාධාරණ වටිනාකමකින් එම සෘණ වන්දි සහිත විශේෂිත පෙර ගෙවිය යුතු මූල්‍ය වත්කම් මැනීමට සමාගම්වලට අවසර ලබාදෙයි.

මෙම ප්‍රමිතිය විසින් LKAS 39 මූල්‍ය උපකරණ ප්‍රතිස්ථාපනය කරන ලදී. ඒ අනුව, වත්කම් කළමනාකරණය කිරීම සඳහා සමාගම විසින් ව්‍යාපාර ආකෘතිය සහ වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි පදනම් කරගෙන සියලුම මූල්‍ය වත්කම් වර්ගීකරණය කර තිබේ.

- ක්‍රමක්ෂය කරන ලද පිරිවැය
- අනිකුත් විස්තීර්ණ ආදයම් තුළින් සාධාරණ අගය (FVOCI)
- ලාභ හෝ පාඩු තුළින් සාධාරණ අගය (FVTPL)

මූල්‍ය වත්කම්වල පසුකාලීන තක්සේරු කිරීම ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

කෙසේ වෙතත්, ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සහ OCI හි වෙනම රේඛීය අයිතමයකින් ඉදිරිපත් කළ යුතු මූල්‍ය වත්කම් හානිකරණයට අවශ්‍ය මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම LKAS 1 සඳහා වැදගත් සංශෝධන සමාගම විසින් යොදාගෙන නොමැත.

3.5.1 මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කම්වලට මුදල් සහ කෙටිකාලීන තැන්පතු, වෙළඳ ලැබිය යුතු, ණය සහ අනිකුත් ලැබිය යුතු මුදල් ඇතුළත් වේ.

මූල්‍ය වත්කම් අනිකුත් ලැබිය යුතු මුදල්, කෙටිකාලීන ආයෝජන සහ මුදල් සමාන දේ ඇතුළත්ව ක්‍රමක්ෂය පිරිවැයට වර්ගීකරණය කොට ඇස්තමේන්තු කරනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැයට හෝ FVOCI ට ඇස්තමේන්තු කර නොමැති සියලුම මූල්‍ය වත්කම් FVTPL ට ඇස්තමේන්තු කරනු ලැබේ.

මූල්‍ය වත්කම් ඒවායේ මූලික හඳුනාගැනීමෙන් පසුව නැවත වර්ගීකරණය කරනු නොලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශන පුරාවට සංසන්දනාත්මක තොරතුරු නව ප්‍රමිතියේ අවශ්‍යතාවය පිළිබිඹු කිරීමට නැවත ප්‍රකාශ කර නොමැත.

ඒකාකාරී ලෙස අදාළ වන යෝජනා ක්‍රමය යටතේ සේවකයින්ට සහනදායී පොලී අනුපාත යටතේ ලබා දෙන ණය ඵලදායී පොලී අනුපාත (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂ වියදම් යටතේ ප්‍රකාශ කරනු ලැබේ. ප්‍රදානය කරන ලද ප්‍රාග්ධනය සම්බන්ධයෙන් ඇති වන අලාභය වර්ෂයේ ලාභ සහ අලාභ ප්‍රකාශයෙන් අය කරනු ලැබේ. 2023 වර්ෂයේ දී ලබා දී ඇති කාර්ය මණ්ඩල ණයවල ඵලදායී පොලී අනුපාත EIR සහ පොලී අනුපාතය (6.50%) එකම මට්ටමක පවතින අතර ලාභ අලාභ ප්‍රකාශනය සඳහා කිසිදු අලාභයක් අය කරනු නොලැබේ.

ලැබිය යුතු දේ අපහායනය කිරීම සඳහා සමාගම විසින් ඒවා සාමූහිකව තක්සේරු කර ඇති අතර සමහර තනි සුවිශේෂී ලැබිය යුතු දේ අපහායනය සඳහා ප්‍රතිපාදන අවශ්‍ය නොවන බවට තීරණය කර ඇත. එයට හේතුව නම් ලැබිය යුතු මුදල් අනුරූප ගෙවිය යුතු මුදල් වලින් අනුබල දෙනු ලබන අතර පැහැර හරිනු ලබන අවස්ථාවකදී ඒවා හිලව් කිරීමේ අවස්ථාව ඇත. මෙමගින් අදහස් කරන්නේ අපහායනය කිරීම සඳහා යම් අයකිරීමක් අවශ්‍ය කරමින් පැහැර හැරීමේදී අනාවරණයවීමක් නොමැති බවය.

තවදුරටත්, ලැබිය යුතු දේ සඳහා ප්‍රධාන වශයෙන් සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ සහ වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයට පසුව මාස දොළහක් (12) ඇතුළත උපලබ්ධිවීමට අපේක්ෂිත අයිතම ඇතුළත් වන අතර එබැවින් ඒවා ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මාස දොළහක් (12) ඇතුළත උපලබ්ධිවීමට අපේක්ෂිත නොවන ශේෂයන් ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

3.5.2 රජයේ සුරක්ෂිත

REPOහි සිදුකරනු ලබන කෙටි කාලීන ආයෝජන, භාණ්ඩාගාර බිල්පත් ආදිය වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ වටිනාකමකින් මනිනු ලැබේ. මෙම ආයෝජන දරනු ලබන්නේ පොලී සහ ප්‍රාග්ධනය යන දෙකෙහිම ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එකතු කිරීමේ අරමුණ සඳහා පමණි.

3.5.3 මූල්‍ය බැරකම්

SLFRS 9 ට අනුකූලව මූල්‍ය වගකීම් වර්ගීකරණය කරනු ලබන්නේ ක්‍රමක්ෂය පිරිවැය හෝ FVTPL ට ඇස්තමේන්තු කරනු ලබන පරිදි ය. FVTPL හි මූල්‍ය වගකීම් සාධාරණ අගයේ වර්ගීකරණය

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

කරනු ලබන අතර ලාභ සහ පාඩු - ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. මූල්‍ය වගකීම් ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට පසුව තක්සේරු කරනු ලැබේ.

3.6 සේවක ප්‍රතිලාභ

3.6.1 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂික

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායකත්ව සැලැස්මක් නොවන පශ්චාත් - සේවක ප්‍රතිලාභ සැලැස්මකි.

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම සම්බන්ධයෙන් ශේෂ පත්‍රයේ හඳුනාගනු ලබන වගකීම සේවකයෙකුගේ විශ්‍රාම ගැන්වීම මත අවශ්‍ය මූල්‍ය බැඳීම් සඳහා සූදානම් කිරීමට පාරිතෝෂික පනතේ දැක්වෙන ප්‍රතිපාදන මත පදනම් වේ. කෙසේ වෙතත්, ප්‍රතිපාදනය කිරීම ආරම්භ වන්නේ සේවයේ පළමු වසර සම්පූර්ණ කිරීමෙනි. ප්‍රතිලාභ සැලැස්ම සඳහා අරමුදල් අභ්‍යන්තර වශයෙන් සපයනු ලබන අතර අවශ්‍ය වූ විටෙක බැඳීම් සපුරාලීම සඳහා අරමුදල් සමාගම විසින් ඉතිරි කිරීමේ ගිණුමක ඇතුළත් කර තිබේ.

LKAS - 19 හි 60 වෙනි ඡේදයෙන් සපයා ඇති පරිදි, සමාගම අදහස් කරන ඇස්තමේන්තු සහ ගණනය කිරීමේ කෙටි ක්‍රම මගින් ප්‍රමිතියෙන් වෙන් කර ඇති සවිස්තරාත්මක ගණනය කිරීම් සඳහා සාධාරණ සමානකමක් සපයන අතර මෙම ප්‍රතිපාදනයට අනුකූලව පාරිතෝෂිතය සඳහා ගිණුම්ගත කර තිබේ.

3.6.2 නිශ්චිත දායකත්ව සැලසුම - සේවක අර්ථසාධක සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදලේ දායකත්වය සඳහා සුදුසුකම් ලබන සියලුම සේවකයින් අනුපිළිවෙල ආඥා පනත් සහ ව්‍යවස්ථා ප්‍රකාරව අදාල දායකත්ව අරමුදල් මගින් ආවරණය වේ. දායකත්ව සැලසුම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

3.7 ප්‍රතිපාදන, අසම්භාවී වත්කම් සහ අසම්භාවී බැරකම්

බැඳීමක් සම්පත් පිටතට ගලායාමකට හේතු විය හැකි අතර, පිටතට ගලා යාමේ ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් කළ හැකි බවට සම්භාවිතාවක් ඇති විට වාර්තා කරන දිනට පවතින සියලුම බැඳීම් සඳහා ප්‍රතිපාදන සලසා තිබේ.

සම්පත්වලින් පිටතට ගලායාම දුරස්ථ වූ විටෙක මිසක අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහනක් ලෙස අනාවරණය කරනු ලැබේ.

ආර්ථික ප්‍රතිලාභ ඇතුළතට ගලාඒම සසම්භාවී වන අවස්ථාවලදී අසම්භාව්‍ය වත්කම් අනාවරණය කරනු ලැබේ.

3.8 ආදායම් ප්‍රකාශනය

3.8.1. ආදායම් හඳුනා ගැනීම - SLFRS 15

SLFRS 15, ආදායම් හඳුනාගනු ලබන්නේද, කොපමණ ප්‍රමාණයක් සහ කිනම් අවස්ථාවේදී ද යන්න තීරණය කිරීම සඳහා පුළුල් රාමුවක් ස්ථාපනය කරයි. ප්‍රමිතියට අනුව, ආදායම හඳුනාගනු ලබන්නේ පාරිභෝගිකයෙකු විසින් භාණ්ඩ සහ සේවාවන්හි පාලනය ලබාගන්නා අවස්ථාවේදීය. පාලනය පැවරීම කාල නිශ්චය තීරණය කරනු ලබන්නේ සමාගමට හිමිවීමට අපේක්ෂා කරන ප්‍රතිෂ්ඨාවකින් පිළිඹිඹු කරන ගණනකින් පාරිභෝගිකයෙකු සඳහා පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවාවන් මාරු කිරීම මගිනි.

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

කොන්ත්‍රාත්තුවක් සඳහා ප්‍රතිපක්ෂය වන්නේ පාරිභෝගිකයා ය. ප්‍රතිෂ්ඨාව හුවමාරු කිරීමේ සාමාන්‍ය ක්‍රියාකාරකම වන අස්ථිත්වයේ නිමැවුම් (ආනයන කරනු ලබන) භාණ්ඩ හෝ සේවා ලබාගැනීම පිණිස පාරිභෝගිකයා අස්ථිත්වය සමඟ ගිවිසුම්ගත වී ඇත. පාරිභෝගිකයා සමඟ ගිවිසුම්ගත වීම ප්‍රමිතියේ දැක්වෙන නිර්ණායකයන් තුළ සිදු වේ.

ආදායම් ඇස්තමේන්තු කරනු ලබන්නේ ලැබූ හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ කොන්ත්‍රාත්ගත වටිනාකමට අනුකූලවය. එබැවින් භාණ්ඩ (ගල්අඟුරු) ලබාදීම මගින් සමාගම කාර්යසාධන බැඳීම සම්බන්ධයෙන් තෘප්තිමක් වනවිට ආදායම හඳුනාගනී. භාණ්ඩ (ගල්අඟුරු) ලබාදුන් විට වත්කමේ පාලනය පාරිභෝගිකයා විසින් ලබාගනී.

ඉන්වොයිස් නිකුත් කිරීමේ කාර්යය පිණිස ගල්අඟුරු මිල කරනු ලබන්නේ ඒවා ජැටිය දක්වා ගෙනගොස් ලබාදීමේදී දැරීමට සිදුවන සියලුම පිරිවැයද ඇතළත්ව ය. භාණ්ඩ ලබාදීම ගැනුම්කරු වෙත ස්ථිර කරනු ලබන්නේ ගල්අඟුරු ජැටිය දක්වා ගෙනගොස් භාරදීමත් සමග බවට සලකනු ලබන අතර ඒ අනුව ගැනුම්කරු වෙත ඉන්වොයිසි කරනු ලැබේ. වැට් පනතේ දැක්වෙන නියමයන් ප්‍රකාරව ගැනුම්කරු සහ විකුණුම්කරු අතර මිල, වැට් බදු අරමුණු සඳහා රේගුව විසින් භාවිතා කරනු ලබන පාදක අගය * ගැනුම්කරු වෙත වැට් බදු ඉන්වොයිසි නිකුත් කිරීමේදී පිරිවැයට එකතු කරනු ලබන සියයට 10 ක කල්පිත ගැලපීමේ අගයට වඩා අඩු නොවිය යුතු ය. කෙසේ වෙතත්, අප විසින් වැට් බදු කලින් එකතු කරන බැවින් වැට් බදු වාර්තා සම්පූර්ණ කරනු ලබන්නේ වැට් බදු ලැබූ දිනය පදනම් කරගෙන ය. ඉන්වොයිසියක් වැට් බදුවල කොටසක් හෝ සම්පූර්ණ එකක් ලෙස සහ ආදායම එකිනෙකට වෙනස් කාර්තු දෙකක් තුළ හඳුනා ගැනීමේ හැකියාවක් පවතී.

ඒ අනුව, සියලුම භාණ්ඩ ගෙනගොස් ලබාදීම සඳහා මිල නියම කරනු ලබන්නේ ගල්අඟුරු බලාගාරයේ ජැටිය දක්වා ගෙනගොස් ලබාදීමේදී දැරීමට සිදුවන පිරිවැය මත ය. වෙනත් ආකාරයකින් පවසන්නේ නම්, මෙට්රික් ටොන් එකක ගල් අඟුරු මිල සෘජු පිරිවැයට සමාන්තරව සකසා ඇත. මීට අමතරව, කළමනාකරණ ගාස්තු ලෙස ශුද්ධ පොදු කාර්ය පිරිවැය සඳහා ඉන්වොයිසියක් නිකුත් කරනු ලැබේ.

3.8.2 වියදම් හඳුනා ගැනීම

කාර්ක්ෂම තත්ත්වයක් තුළ ව්‍යාපාරය කරගෙන යාමේදී සහ දේපළ, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමේදී දැරීමට සිදුවන සියලුම වියදම් වර්ෂයේ ලාභයට එළඹීම කරන කොට ගෙන ආදායමට අයකර ඇත. ව්‍යාපාරය කරගෙන යාමේ හෝ ව්‍යාපාරයේ ධාරිතාවය වැඩිකර ගැනීමේ අර්ථයෙන් ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කරගැනීමේ සහ විස්තීර්ණ කිරීමේ හෝ වැඩිදියුණු කිරීමේ කාර්යය පිණිස දැරීමට සිදුවන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකා ඇත.

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණින්, සමාගමේ ක්‍රියාකාරිත්වයේ අංග සාධාරණ ලෙස ඉදිරිපත් කරන පදනම මත,වියදම් වල ක්‍රියාකාරිත්වයල ක්‍රමය අනුගමනය කර තිබේ.

3.9 සම්බන්ධිත පාර්ශව හෙලිදරව් කිරීම්

3.9.1 සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු

සමාගම සිය සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 හි සම්බන්ධිත පාර්ශවයන් ලෙස අර්ථ දක්වා ඇති පාර්ශවයන් සමඟ ගනුදෙනු කරනු ලැබේ. එවැනි ගනුදෙනුවලට අදාල කරගනු ලබන මිල නියම කිරීම්, අවදානම් තක්සේරු කිරීම් සහ සමාග

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

මේ මිල නියම කිරීමේ ආකෘතිය මත පදනම් වන අතර එය සමාගම සහ එහි අසම්බන්ධිත ගනුදෙනුකරුවන් අතර සිදුවෙන ගනුදෙනුවලට අදාල කරගනු ලබන මිල නියම කිරීම හා සංසන්දනීය වේ. මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වල, එනම් සටහන අංක 28 හි හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

3.9.2 ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සමඟ ගනුදෙනු

සම්බන්ධිත පාර්ශව හෙලිදරව් කිරීම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 ට අනුව, ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් යනු අස්ථිත්වයේ සැලසුම් කිරීම, මෙහෙයවීම සහ පාලනය කිරීම යන ක්‍රියාකාරකම් සඳහා අවසරය සහ වගකීම ඇති පුද්ගලයින් වේ. සමාගමේ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් ලෙස වර්ගීකරණය කර ඇත්තේ එහි අධ්‍යක්ෂ මණ්ඩලය වේ.

3.10 මූල්‍ය පිරිවැය

මූල්‍ය පිරිවැයට සියලුම පොලී සහ ණයට ගැනීම් සම්බන්ධයෙන් දැරීමට සිදුවන අනිකුත් පිරිවැය ඇතුළත් වන අතර ඒවා ප්‍රාග්ධනීකරණය කරන යෝග්‍යතා වත්කම සම්බන්ධයෙන් දරනු ලබන මිසක දැරීමට සිදුවූ කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

විනිමය ලාභය/අලාභය - ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම යන දෙදෙනාම ඇමරිකානු ඩොලර් ගිණුම් හරහා සිදු කරන සෑම සැපයුම්කරුවෙකුගේම ගෙවීම් සඳහා බරිත සාමාන්‍ය විනිමය අනුපාතයක් භාවිතා කිරීමට එකඟ විය. විනිමය ලාභය හෝ අලාභය තීරණය කරනු ලබන්නේ වර්ෂය අවසාන බැංකු ශේෂය ශ්‍රී ලංකා මහ බැංකු (CBSL) විනිමය අනුපාතය සමඟ සැසඳීමෙන් සහ මූල්‍ය පිරිවැය/ආදායම යටතේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සටහන් කිරීමෙනි.

3.11 කොටසකට ඉපයීම

කොටසකට ඉපවීමක් (EPS) නොමැත. ලංකා විදුලිබල මණ්ඩලය සමඟ ඇතිකරගත් නව ගිවිසුමට අනුව අයකරනු ලබන මිල, ගල්අඟුරු ජැටිය දක්වා ගෙනගොස් භාරදීමේ මෙහෙයුම් කාර්යයට සමාන වේ. ඊට අමතරව, ලාභ හෝ අලාභ නොමැති තත්ත්වයකට මෙහෙයවමින් ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙසේ පොදු කාර්ය පිරිවැයද ප්‍රතිපූරණය කරනු ලැබේ.

3.12 ආදායම් බදු වියදම්

ආදායම් බදු, වර්තමාන බදුවලින් සමන්විත වේ. ආදායම් බදු හිමිකම්වල සෘජුවම හඳුනා ගන්නා අයිතමවලට අදාල වන ප්‍රමාණයට හැර ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. ලංකා විදුලිබල මණ්ඩලය විසින් ප්‍රතිපූරණය කිරීම සඳහා ආදායම් බදු වියදම්වල යෝග්‍යතාව සලකා බැලීමේදී, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ගාස්තු අයකිරීමක් විස්තර කර නොමැත.

සෘජු සහ වක්‍ර පිරිවැය සමගාමීව සමායන මිල ආකෘතිය අනුගමනය කිරීම යොදා ගැනීම නිසා බදු බලපෑම ප්‍රමාණාත්මක නොවේ. කාලය වෙනස් කිරීම සඳහා සිදුකරනු ලබන යම් ගැලපීමක් ප්‍රමාණාත්මක බලපෑමක ප්‍රතිඵලයට ඉඩක් නොමැති වන බැවින් විලම්බිත බදු සඳහා ප්‍රතිපාදන සපයා නොමැත.

3.13 වර්තමාන බදු

වර්තමාන බදු යනු වාර්තා කරනු ලබන දිනට පනවා ඇති බදු අනුපාත සහ පෙර වර්ෂ සඳහා ගෙවිය යුතු බදුවලට සිදුකරන ලද යම් ගැලපීමක් භාවිතා කරමින් වර්ෂය සඳහා බදුවන ආදායම් මත ගෙවිය යුතු යැයි අපේක්ෂිත බදු වේ.

මූල්‍ය ප්‍රකාශනවල වර්තා කර ඇති පරිදි අදායම් බදු සඳහා ප්‍රතිපාදන ආදායමේ සහ වියදමේ මූලිකාංග මත පදනම් වන අතර 2017 අංක 24 දරණ දේශීය ආදායම් බදු පනතේ දැක්වෙන ප්‍රතිපාදන සහ

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

ඊට සිදුකරන ලද පසු සංශෝධනවලට අනුකූලව ගණනය කරනු ලැබේ.

3.13.1 ආර්ථික සේවා ගාස්තු (ESC)

2019 අවසානය දක්වා සමාගම ESC ගෙවීමට බැඳී සිටීම 2020 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එය අහෝසි කර ඇත.2021 මූල්‍ය පනත යටතේ ESC ඉවත් කර ඇති බව IRD තහවුරු කිරීමෙන් පසු 2022 ජූනි 30 දින සිට බලපැවැත්වෙන පරිදි IRD වෙත ගෙවිය යුතු CEB වෙතින් ලැබිය යුතු ESC ආපසු හැරවීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇත.

3.14 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර ඇත්තේ වක්‍ර ක්‍රමය භාවිතා කරමිනි. ගෙවනු ලබන පොලී මෙහෙයුම් මුදල් ප්‍රවාහ ලෙස වර්ග කර ඇති අතර ගෙවන ලද ලාභාංශ මූල්‍ය මුදල් ප්‍රවාහ ලෙස වර්ග කෙරේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ අරමුණින් ලැබෙන පොලී සහ ලාභාංශ ආයෝජන මුදල් ප්‍රවාහ ලෙස වර්ග කෙරේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අරමුණ සඳහා, මුදල් සහ මුදල් සමාන දෑ බැංකුවේ ඇති මුදල් සහ අතැති මුදල් සහ හිඟ බැංකු අයිරා වල ශුද්ධ කෙටි කාලීන තැන්පතු වලින් සමන්විත වේ.

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

		2023 රු.	2022 රු.
4	**ආදායම**		
	පිරිවැටුම	161,333,588,954	117,337,279,052
	ලංවිම මගින් වියදම් ප්‍රතිපූරණය කිරීම	74,629,080	69,008,169
		161,408,218,035	**117,406,287,221**
4.1	**ශුද්ධ පොදුකාර්ය පිරිවැය ගණනය කිරීම**		
	පරිපාලන වියදම්	(74,286,749)	(78,525,284)
	මූල්‍ය පිරිවැය	(28,342,495)	(65,154)
	ලියාපදිංචි සහ අනෙකුත් ආදායම්	19,004,116	8,221,503
	මූල්‍ය ආදායම්	8,996,047	1,360,766
	කාල සීමාව (මාස 12) සඳහා ශුද්ධ පොදු කාර්ය පිරිවැය	**(74,629,080)**	**(69,008,169)**
5	**විකුණුම් පිරිවැය**		
	නැව තෙක් අගය	123,992,104,255	95,937,963,424
	නැව් ගාස්තු	20,008,428,217	9,769,201,732
	බත්තල් ගාස්තු	2,026,194,376	1,033,181,174
	නැවිගත කිරීම් සහ අනෙකුත් ගාස්තු	402,233,469	1,177,281,024
	මුදල් වට්ටම් (සියයට 10 රේගු ආන්තිකය)෧	14,904,628,637	9,419,651,697
		161,333,588,954	**117,337,279,052**

*වැට් බදු පනතේ නියමයන්ට අනුව, ගැනුම්කරු සහ විකුණුම්කරු අතර මිල රේගුව විසින් භාවිතා කරන වැට් බදු අරමුණු සඳහා වන මූලික අගයට වඩා අඩු විය නොහැකි අතර ගැනුම්කරුට වැට් ඉන්වොයිසි නිකුත් කිරීමේ පිරිවැයට සියයට 10 කල්පිත ගැලපුම එකතු කෙරේ.

6	**ලියාපදිංචි සහ අනෙකුත් ආදායම්**		
	ලියාපදිංචි සහ අනෙකුත් ආදායම්	19,004,116	8,221,503
		19,004,116	**8,221,503**
7	**මූල්‍ය ආදායම්**		
	පොළී ආදායම් සහ හැසිරවීමේ ආදායම්	8,996,047	1,360,766
		8,996,047	**1,360,766**

8 බදු ගෙවීමට පෙර ලාභය

පහත සඳහන් දෑ ඇතුළුව සියලුම වියදම් අයකිරීමෙන් පසු බදු පෙර ලාභය සඳහන් වේ.

කාර්යමණ්ඩල වැටුප්	30,095,102	35,697,362
සේ.අ.අ (EPF)	3,594,369	4,295,944
සේ.නි.හා.අ (ETF)	898,592	1,073,986
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන	1,467,000	2,559,190
අධ්‍යක්ෂක ගාස්තු	1,000,000	600,000
ක්ෂයවීම්	2,713,713	2,844,726
විගණන ගාස්තු	515,200	500,000
	40,283,976	47,571,208

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

		2023 රු.	2022 රු.
9	ආදායම් බදු වියදම් අ) වර්තමාන ආදායම් බදු වියදම්		
	වර්ෂය සඳහා ලාභය මත බද්ද (සටහන 9.1)	**2,578,076**	**498,665**
	පෙර වර්ෂවලට අදාළ අධි/ඌණ ප්‍රතිපාදන	-	-
	මුළු වර්තමාන ආදායම් බදු වියදම්	**2,578,076**	**498,665**
	ආ) විලම්භිත බදු වියදම් (සටහන 9.3)	-	-
	ආදායම් බදු වියදම් (සටහන 9.2)	**2,578,076**	**498,665**

9.1 බදු වියදම් සහ ගිණුම්කරණ ලාභය/(අලාභ) අතර සංඛ්‍යාත්මක සැසඳීම.

බදු වියදම් සහ ගිණුම්කරණ ලාභයේ නිෂ්පාදිතය ව්‍යවස්ථාපිත බදු අනුපාතිකයෙන් ගුණ කිරීම අතර සැසඳීම පහත පරිදි වේ.

බදු පෙර ලාභය	-	-
වර්ෂය සඳහා ඉඩ නොදෙන වියදම්	4,180,713	5,408,970
වර්ෂය සඳහා ඉඩ දෙන වියදම්	(9,863,840)	(2,393,719)
වර්ෂය තුළ භාවිතා කරන ලද බදු අලාභය (ව්‍යාපාරයෙන් තක්සේරු කළ හැකි අලාභය)	(5,683,127)	3,015,251
පොලී ආදායම්	8,996,047	1,360,766
තක්සේරු කළ හැකි ශුද්ධ ආදායම්	**8,996,047**	**4,376,017**
ව්‍යවස්ථාපිත ආදායම් බදු අනුපාතය 30% (2021-30%)		
අනෙකුත් ආදායම් මාර්ග මත බදු බලපෑම (පොළී ආදායම)	2,698,814	408,230
ඉඩ නොදෙන වියදම්වල බදු බලපෑම	0	1,622,691
ඉඩ දෙන වියදම්වල බදු බලපෑම	0	(718,116)
පෙර වර්ෂවලට අදාළ වර්තමාන බදුවල අධි/ඌණ ප්‍රතිපාදන	(120,738)	(814,140)
ආදායම් ප්‍රකාශනයේ වාර්තා කරන ලද ආදායම් බදු වියදම්	**2,578,076**	**498,665**
ඵලදායී ආදායම් බදු අනුපාතයේදී	30%	30%

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

9.2 සමාගමේ ආදායම් බදු වියදම, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත ප්‍රකාරව 30% හි (2022 - 30%) ගලපන ලද ලාභය මත ගණනය කර ඇත. කෙසේ වෙතත්, ලංවිම සමග ඇතිකර ගන්නා ලද ගිවිසුමට අනුව උපයෝගී කරගනු ලැබූ සමායන මිල නියම කිරීමේ ආදර්ශය පෙරදැරි කරගෙන ලංවිමෙන් ප්‍රතිපූරණය කිරීමට ආදායම් බදු වියදම් යෝග්‍ය වේ. එසේ හෙයින්, වර්ෂය සඳහා බදු වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පෙන්වා නොමැත.

9.3 තවදුරටත්, විලම්බිත බදු * බදු වියදම්වල ප්‍රමාණාත්මක වෙනසක ප්‍රතිඵලයක් අපේක්ෂා නොවන තත්ත්වයකදී පවා, එසේ හෙයින් බදු වියදම් අඩුකිරීමේදී විලම්බිත බදු සැලකිල්ලට නොගනු ලැබීය.

කොටස්කරුවන් පිළිබඳ තොරතුරු

	2022	
	කොටස් ගණන	%
ලංකා විදුලිබල මණ්ඩලය	1,200,000	60
භාණ්ඩාගාරය	400,000	20
ලංකා නැව් සංස්ථාව	200,000	10
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	200,000	10
වර්ෂය තුළ මුළු කොටස් ගණන	2,000,000	100

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

10. දේපළ, පිරියත සහ උපකරණ

පිරිවැය/ප්‍රත්‍යාගණනය	2023.01.01 දිනට ශේෂය	එකතු කිරීම්	ප්‍රත්‍යාගණනය මත ක්ෂය මාරුකිරීම	ප්‍රත්‍යාගණය ලාභ/අලාභ	අපහරණය කිරීම්/ මාරුකිරීම්	2023.12.31 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.	රු.	රු.
සින්නක්කර වත්කම්						
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	3,546,467	-	--	-	-	3,546,467
පරිගණක	4,285,657	1,187,999	-	-	-	5,473,656
උපකරණ	2,643,921	225,000	-	-	-	2,868,921
කල්බදු වැඩිදියුණු කිරීම	1,702,582	-	-	-	-	1,702,582
ජාල පද්ධතිය	265,775	-	-	-	-	265,775
මෝටර් රථ	7,875,000	-	-	-	-	7,875,000
ජනන යන්ත්‍ර	845,000	-	-	-	-	845,000
කන්ටේනර් සඳහා ඉඩ සැලසීම	6,744,085	-	-	-	-	6,744,085
	27,908,486	**1,412,999**	**-**	**-**	**-**	**29,321,485**

ක්ෂයවීම්	2023.01.01 දිනට ශේෂය	එකතු කිරීම්	ප්‍රත්‍යාගණනය මත ක්ෂය මාරුකිරීම	ප්‍රත්‍යාගණය ඉපයීම/(පාඩුව)	අපහරණය කිරීම්/ මාරුකිරීම්	2023.12.31 දිනට ශේෂය
	රු.	රු.	රු.	රු.	රු.	රු.
සින්නක්කර වත්කම්						
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	2,907,617	209,502	-	1,915	-	3,119,034
පරිගණක	3,896,929	381,417	-	(81,718)	-	4,196,627
උපකරණ	2,257,866	154,045	-	82,504	-	2,494,414
කල්බදු වැඩිදියුණු කිරීම	1,702,582	-	-		-	1,702,582
ජාල පද්ධතිය	265,775	-	-		-	265,775
මෝටර් රථ	3,937,500	1,968,750	-		-	5,906,250
ජනන යන්ත්‍ර	845,000	-	-		-	845,000
කන්ටේනර් සඳහා ඉඩ සැලසීම	6,744,085	-	-		-	6,744,085
	22,557,353	2,713,713	-	2,700	-	25,273,767

ශුද්ධ පොත් අගය	2023.01.01 දිනට ශේෂය					2023.12.31 දිනට ශේෂය
	රු.					රු.
සින්නක්කර වත්කම්						
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	638,850	-	-	-	-	427,433
පරිගණක	388,727	-	-	-	-	1,277,028
උපකරණ	386,056	-	-	-	-	374,507
කල්බදු වැඩිදියුණු කිරීම	-	-	-	-	-	-
ජාල පද්ධතිය	-	-	-	-	-	-
මෝටර් රථ	3,937,500	-	-	-	-	1,968,750
ජනන යන්ත්‍ර	-	-	-	-	-	-
කන්ටේනර් සඳහා ඉඩ සැලසීම	-	-	-	-	-	-
මුළු ධාරණ අගය	5,351,133					4,047,718

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

110.1 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී සමාගම විසින් රු.1,412,999/- ක් (2022 දී රු. 571,688/-) වටිනා දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කරගෙන ඇති අතර, වර්ෂය තුළදී දේපළ, පිරියත සහ උපකරණ සඳහා රු. 1,412,999/- මුදලක් මුදලින් ගෙවා ඇත.

10.2 දේපල, පිරියත සහ උපකරණ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුළ සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් ඇතුළත් වන අතර එහි දළ ධාරණ අගය රු.1,108,977/- (2022 - රු.1,864,160/).දේපල, පිරියත සහ උපකරණ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුළ සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් ඇතුළත් වන අතර එහි දළ ධාරණ අගය රු.18,090,888/*

10.3 මෝටර් රථ තක්සේරුකරුවෙකු වන රජයේ ලියාපදිංචි අංක පිවී 70496/එල්ඒඑස්එල්/වී/007 දරණ ද සිල්වා ඉංජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද මෝටර් රථ 2020.12.31 වෙනි දින ප්‍රත්‍යාගණනය කොට ස්වාධීන තක්සේරු වාර්තාවක් ඉදිරිපත් කර ඇත. ප්‍රත්‍යාගණනය කරන ලද මෝටර් රථවල විස්තර පහත පරිදි වේ. ප්‍රත්‍යාගණනය කරන ලද මෝටර් රථවල ඵලදායී ආයු කාලය වසර 4ක් ලෙස ගණන් බලා ඇත.

වාහන අංකය	වර්ගය	ප්‍රත්‍යාගණිත වටිනාකම
WP PC-0575	L200 මට්සුබිෂි ඩබල් කැබ් පිකප් රථය	5,400,000.00
WP KJ-0610	පෙරඩෝවා විවා-එලයිට් මෝටර් රථය	1,725,000.00
WP AAU-5949	බජාජ් ත්‍රිවීලරය	750,000.00
		7,875,000.00

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

		2023 රු.	2022 රු.
11	**අනෙකුත් ජංගම නොවන වත්කම්**		
Liberty Commodities Ltd		236,785,640	236,785,640
CSCL(TISCL) *සටහන		589,973ළ845	589,973,845
		826,759,484	**826,759,484**

* මෙය CSCL ආයතනය මගින් ගල්අඟුරු සැපයීම වෙනුවෙන් Taurian Iron and Steel Company Pvt Ltd වෙතින් අයවිය යුතු මුදල වේ. එම මුදල ලැබුණු පසුව ලංවිමට අප විසින් ගෙවිය යුතු අතර ගෙවිය යුතු අනුරූප මුදල සටහන් අංක 20 ජංගම නොවන වගකීම්වල පිළිබිඹු කෙරේ. ගිණුම් අතර තිබෙන වෙනස, ගිවිසුමට අනුව මිල ඉහළයාම මගින් විස්තර කරනු ලැබේ.

12	**වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ**			
වෙළඳ ලැබිය යුතු දෑ - සම්බන්ධිත පාර්ශවයන්		12.1	32,507,339,407	7,772,883,573
වෙළඳ ලැබිය යුතු දෑ - අනෙකුත්		12.2	23,720,147	24,509,402
අනෙකුත් ලැබිය යුතු දෑ - සම්බන්ධිත පාර්ශවයන්		12.3	104,012,222	68,577,677
අනෙකුත් ලැබිය යුතු දෑ - අනෙකුත්		12.4	1,149,902	1,504,098
			32,636,221,678	7,867,474,749

12.1	**වෙළඳ ලැබිය යුතු දෑ - සම්බන්ධිත පාර්ශවයන්**		
ලංවිමෙන් ලැබිය යුතු අවසන් වැට් සහ අනෙකුත්		197,452,711	197,452,711
තාප ගල් අඟුරු නැවිගත කිරීම් සඳහා වෙළඳ ණයගැතියන් (ලංවිම)		31,692,270,437	7,570,163,218
ලංකා බැංකුවෙන් ලැබිය යුතු ණය පොලී		191,835,779	-
ලංවිම වෙතින් ලැබිය යුතු විනිමය අලාභය		51,632	5,267,644
ගොඩබෑමේ වරායේ කලින් ගෙවූ ප්‍රමාද ගාස්තුව - CSCL		425,728,849	-
		32,507,339,407	7,772,883,573

12.2	**වෙළඳ ලැබිය යුතු දෑ - අනෙකුත්**		
Liberty Commodities Ltd වෙතින් ලැබිය යුතු 50% SGS ගාස්තු		8,048,531	8,048,531
විවිධ ණයගැතියන්		9,808,968	9,808,968
නැවිගත කිරීම් පාලනය		1,251,647	4,618,977
ලංවිමෙන් ලැබිය යුතු බදු	12.2.1	4,611,002	2,032,926
		23,720,147	24,509,402

* වෙළඳ ණයහිමියන් තුළ ඇතුළත් (රු. 85,887,776.09) ක ගෙවිය යුතු ශේෂයට එරෙහිව, Noble Resources International Pte Ltd වෙතින් ලැබිය යුතු රු.1,115,987 ක් හිලව් කිරීමට සිදුවේ.

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

		2023 රු.	2022 රු.
12.2.1	**ලංවිමෙන් ලැබිය යුතු බදු**		
	ආදායම් බදු	4,611,002	2,032,926
		4,611,002	**2,032,926**

2021 මූල්‍ය පනත යටතේ ESC අත්හැරීමට ෂසෘ විසින් තහවුරු කර ඇති බැවින් CEB වෙතින් ලැබිය යුතු ESC ආපසු හැරවීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇත.

12.3	**අනෙකුත් ලැබිය යුතු දෑ - සම්බන්ධිත පාර්ශවයන්**		
	කළමනාකරණ ගාස්තු	104,012,222	68,577,677
		104,012,222	**68,577,677**

ලංවිම සහ LCC අතර ගිවිසුමට අනුව, කළමනාකරණ ගාස්තුව (ශුද්ධ පොදු කාර්ය පිරිවැය) ගෙවීම තීරණය කරනු ලබන්නේ පෙර වර්ෂය සඳහා විකුණුම්කරුගේ විගණනය කරන ලද ගිණුම් පදනම් කරගෙන ය.

12.4	**අනෙකුත් ලැබිය යුතු දෑ - අනෙකුත්**		
	පෙරගෙවුම් - කාර්යාල කුලිය	1,096,902	1,474,098
	අනෙකුත් පෙරගෙවුම් සහ අත්තිකාරම්	50,000	30,000
	ලැබිය යුතු දෑ අනෙකුත්	3,000	-
		1,149,902	**1,504,098**
	සැපයුම්කරුවන්ට ගෙවූ අත්තිකාරම්	3,783,443,652	9,533,023,217
13	**ආපසු ගෙවන තැන්පතු**		
	ආපසු ගෙවන තැන්පතු	665,310	67,000
	CSCL මගින් තැන්පත් කිරීම්	50,000	50,000
		715,310	**117,000**
14	**මූල්‍ය වත්කම්**		
	මහජන බැංකුවේ ස්ථාවර තැන්පතු ආයෝජනය	64,653,478	20,981,068
		64,653,478	**20,981,068**
15	**කාර්යමණ්ඩල සඳහා ණය**		
	ආපදා ණය	3,643,680	1,759,734
	උත්සව අත්තිකාරම් සහ වැටුප් අත්තිකාරම්	165,000	99,000
		3,808,680	**1,858,734**
16	**ලැබිය යුතු බදු**		
	ශ්‍රී ලංකා රේගුව වෙතින් ලැබිය යුතු වැට්	29,266,966	29,266,966
	ගෙවූ ආදායම් බදු අත්තිකාරම්	-	-
		29,266,966	**29,266,966**

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

අයවිය යුතු වැට් බදු, ගල්අඟුරු නැව්බඩු තොගයක් ආනයනය කරනු ලැබූ අවස්ථාවේදී ශ්‍රී ලංකා රේගුව වෙත වැඩිපුර ගෙවන ලද මුදලකි. වැට් බදු වැඩිපුර ගෙවීම, නිෂ්කාශන නියෝජිතයා විසින් රේගු අරමුණ පිණිස නැව්බඩු තොගයක වැඩිකළ අගයක් පදනම් කරගෙන ප්‍රකාශයට පත්කිරීමේ ප්‍රතිඵලය වේ. මුදල් ආපසු ලබාගැනීමේ හිමිකම් පෑමක් මේ වනවිටත් අප විසින් ඉදිරිපත් කර ඇති අතර එකී මුදල් ආපසු ලබාදීමට හෝ රේගුවට ගෙවිය යුතු ශේෂයන්ට හිලව් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග රේගු දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇත.

		2023 රු.	2022 රු.
17	**බැංකුවේ තිබෙන මුදල් සහ අතැති මුදල්**		
	ලංකා බැංකුව - ජංගම ගිණුම් අංක 7952807	5,471,373	11,233,569
	ලංකා බැංකුව ඉ/හි - ගිණුම් අංක 9225340	26,112	25,455
	මහජන බැංකු විදේශ මුදල්	910,953,955	-
	ඇ.ඩො.ගිණුම් අංක 004-4021-30000745		
	මහජන බැංකු ජංගම ගිණුම් අංක 004-1001-30000745	21,661,014	28,026,409
	මහජන බැංකු ඉ/හි - ගිණුම් අංක 004-2002-00000745	10,214	-
	මහජන බැංකුවේ ඉතුරුම් සහතික	388,325	377,574
	පාරිතෝෂික අරමුදල - ඉතිරි කිරීමේ ගිණුම	5,802,531	5,638,991
		5,249,313,355	**45,301,997**
18	**ප්‍රකාශිත ප්‍රාග්ධනය**		
	සම්පූර්ණයෙන් ගෙවන ලද සාමාන්‍ය කොටස්	**20,000,000**	20,000,000
		20,000,000	20,000,000
19	**විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්**		
	වර්ෂය ආරම්භයේදී ශේෂය	8,078,510	5,519,320
	වර්ෂය සඳහා ප්‍රතිපාදන	1,467,000	2,559,190
	වර්ෂය තුළ කරන ලද ගෙවීම්	-	-
	කාලපරිච්ඡේදය අවසානයේදී ශේෂය	**9,545,510**	**8,078,510**

ප්‍රතිලාභ සැලැස්ම අභ්‍යන්තරව අරමුදල් සපයනු ලබන අතර සමාගම විගණනය කරන ලද ගිණුම් අවසන් කිරීමෙන් පසු ඒවා පැනනගින විට සහ ඒවා ඉටු කිරීම සඳහා ඉතුරුම් ගිණුමක අරමුදල් වෙන් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

		2023 රු.	2022 රු.
20	**අනෙකුත් ජංගම නොවන වගකීම්**		
	ලංවිමට ගෙවිය යුතු අත්තිකාරම් (Liberty & Taurian)	714,965,434	714,965,434

* අනුරූප ලැබිය යුතු සටහන 11 වෙනත් ජංගම නොවන වත්කම් වලින් පිළිබිඹු වේ.

21	**වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ**			
	වෙළඳ ගෙවිය යුතු දෑ - සම්බන්ධිත පාර්ශවයන්	21.1	1,813,163,630	10,080,875,539
	වෙළඳ ගෙවිය යුතු දෑ - අනෙකුත්	21.2	23,774,331,878	7,400,494,649
	අනෙකුත් ගෙවිය යුතු දෑ - අනෙකුත්	21.3	45,331	45,331
			25,587,540,839	**17,481,415,520**

21.1	**වෙළඳ ගෙවිය යුතු දෑ - සම්බන්ධිත පාර්ශවයන්**		
	සීමාසහිත ලංකා නැව් සංස්ථාව - නව	688,645,343	513,185,356
	සීමාසහිත ලංකා නැව් සංස්ථාව - පැරණි	34,562,813	34,562,813
	CFR, වැට් බදු සහ ප්‍රමාද ගාස්තු සඳහා ලද අත්තිකාරම් (ලංවිම)	1,089,955,474	9,533,127,371
		1,813,163,630	**10,080,875,539**

21.2	**වෙළඳ ගෙවිය යුතු දෑ - අනෙකුත්**		
	ගල්අඟුරු සැපයුම්කරු	1,779,021,604	3,036,232,074
	ගෙවිය යුතු භාණ්ඩ රක්ෂණය	13,615,352	10,187,269
	SGS Lanka (Pvt& Ltd)	12,161,313	12,161,313
	වෙළඳ ණයහිමියන්	87,802,599	87,965,676
	රේගු/දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු වැට් බදු*	20,930,726,267 3	4,253,925,278
	ගෙවිය යුතු රේගු අතිකාල	126,720	23,040
	කාර්යසාධනය සහතික	950,878,023	-
		23,774,331,878	**7,400,494,649**

අ. විදුලිබල අමාත්‍යාංශය හරහා කරන ලද ඉල්ලීම මත පදනම්ව, 2023 දී ලංවිම ද්‍රවශීලතා සීමාවන් හේතුවෙන් 2022/2023 ගල් අඟුරු වාරයේ සිට තාවකාලික වැට් බදු ගෙවීම කල් දැමීමට මුදල් අමාත්‍යාංශය අවසර ලබා දුන්නේය. දැන් නැව් වාරයෙන් වාරයට හිඟය පියවනු ලබන අතර වාර්තා කරන දිනට ගෙවිය යුතු ශේෂය රු.බිලියන 14.8 කි.

ආ. 2017/2018, 2018/2019, සහ 2019/20 වසර සඳහා ගෙවිය යුතු හිඟ වැට් බද්ද මත ලංකා ගල් අඟුරු සමාගම (LCC) හට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) වෙතින් තක්සේරු කිහිපයක් ලැබී ඇත. IRD හි නිමැවුම් මත වැට් බදු ගණනය කිරීම සමග LCC එකග නොවූ නිසා, ඉහත සඳහන් කළ වැට් බදු තක්සේරු සඳහා අභියාචනය සමග, LCC විසින් සංශෝධිත වැට් බදු ප්‍රතිලාභ IRD වෙත ඉදිරිපත් කරන ලදී.

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

		2023 රු.	2022 රු
21.3	**අනෙකුත් ගෙවිය යුතු දෑ - අනෙකුත්**		
	ගෙවිය යුතු පඩි	45,331	45,331
		45,331	**45,331**
22	**පොලී සහිත ණය සහ ණය ගැනීම්**		
	ලංකා බැංකුව - කාලීන ණය	15,969,270,215	-
	ලංකා බැංකුව සඳහා ගෙවිය යුතු පොලී - කාලීන ණය	186,833,039	-
		16,156,103,254	**-**
23	**උපචිත වියදම්**		
	ගෙවිය යුතු සේ.අ.අ./සේ.නි.භා.අ.	3,537,237	1,470,882
	නිති, විගණන සහ වෘත්තීය ගාස්තු	545,753	532,153
	ප්‍රයෝජනයට නොගත් අසනීප නිවාඩු සඳහා ගෙවීම්	1,971,587	1,971,587
	ප්‍රසාද දීමනා	286,620	168,115
	වෙනත්	144,209	126,608
		6,485,406	**4,269,346**
24	**ගෙවිය යුතු ආදායම් බදු**		
	වර්ෂය ආරම්භයේදී ශේෂය	1,900,659	6,619,781
	වර්ෂය සඳහා ප්‍රතිපාදන	2,578,076	498,665
	වර්ෂය තුළ කරන ලද ගෙවීම්	(393,736)	(5,217,787)
	වර්ෂය අවසානයේදී ශේෂය	**4,084,998**	**1,900,659**

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

25 බැඳීම් සහ අසම්භාව්‍යතා

ඒ ඒ කාරණයට ඉදිරියෙන් දක්වා ඇති හේතූන් නිසා ලංකා නැව් සංස්ථාවේ වාර්තාවන් සම්බන්ධයෙන් සමාගම විසින් පහත වෙනස්කම් හඳුනාගෙන ඇත.

වියදමේ ස්වභාවය	ශ්‍රී ලංකා රු.	හේතුව
(1) නැව් ගාස්තු	213,401	ඩෙෆ් කෝල්වල නැව් ගාස්තු (නැව් අංක 01) - තහවුරු කිරීම අපේක්ෂාවෙන් සිටී.
	15,211,259	ලංකා ගල්අඟුරු සමාගම විසින් නැව්බඩු තොග 08ක නැව් ගාස්තු සංශෝධනය කිරීම සඳහා හර සටහනක් නිකුත් කරන ලදි. එහෙත් CSC විසින් බැර කර නොමැත.
(2) බත්තල් ගාස්තු	62,707,947	දේ.ආ.දෙ විසින් 0% ක් ලෙස නියම කර තිබූ බත්තල් ගාස්තු මත වැට්
	(41,430,513)	384/16 නැව්ගත කිරීමේ බත්තල් ගාස්තු ඕක විසින් හිණුම්ගත කර නොමැත.
(3) බංකර් ගැලපුම් ගාස්තු	12,311,421	බේස් බංකර් මිල මෙ.ටො. 1 ට ඇ.ඩො. 11 ක් ලෙස මිළ සටහන් කරන ලද අතර එහෙත් චිල්සීසී විසින්ගනු ලැබුවේ මෙ.ටො. 1 ට ඇ.ඩො. 10.75ටය. (ගිවිසුම පරිදි)
(4) නැව් ගැලපුම් ගාස්තු	113,133	නැව් ගාස්තු ගැලපුම් වෙනස ගණනය කිරීම - නැව්බඩු අංක 210-21
(5) ඩීසල් ගාස්තු වැඩිවීම	(6,036,448)	384/16 නැව්ගත කිරීමේ ඩීසල් වැඩිවීම ඕක විසින් ගණන් බලා නොමැත.
(6) ප්‍රමාද ගාස්තු - පැටවුම් වරාය	69,424,040	ලිබර්ටි කොමොඩිටීස් හි විභාග වෙමින් පවතින නිතිමය නඩුවකට අදාළව ඇමරිකානු ඩොලර් 412,000/-
	9,405,413	සීවිස්සී හි එකඟත්වය ඇතිව මෙම ගෙවීම් එකතු කිරීමෙන් පසුව පියවනු ලැබේ (201/12)
ප්‍රමාද ගාස්තු - ගොඩබෑමේ වරාය	53,377,050	අවසාන ගණනය කිරීම් සඳහා අදාළ පාර්ශවයන් විසින් එකග නොවේ.
	425,728,849	ගොඩබෑමේ වරාය ප්‍රමාද ගාස්තු/පිටත් කිරීමේ පියවීම් සඳහා CSC වෙත ගෙවන ලද අත්තිකාරම්
(7) ගොඩබෑම් වරායේ ගොඩබෑම් ගාස්තු	56,670,147	විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු ගොඩබෑම් වරායේ හිග මුදලට එරෙහිව සැපයුම්කරු විසින් අඩු කරන ලදී
(8) විනිමය ලාභ/අලාභ	106,747,947	විනිමය ලාභ/අලාභ තහවුරු කිරීම ලංවිම වෙතින් බලාපොරොත්තු වේ
(9) නිෂ්කාශනය, ඉදිරියට යැවීම සහ වියදම් ගෙවීම	6,843,417	LCC විසින් රේගු දඩ සඳහා හර සටහන නිකුත් කරන ලද නමුත් CSC බැර කර නැත.
	1,272,172	භාණ්ඩ රක්ෂණය බකස විසින් අඩු කරන ලද නමුත් ඕක තවමත් ගැලපීම් සිදු කර නැත.
	28,783,674	මතභේදයට තුඩු දී ඇති නැව්ගත කිරීමේ භාණ්ඩ ප්‍රවාහනය - නැව් අංක 19 (Taurian)
(10) බැංකු කොමිස් ගාස්තු	26,985,242	CSC වාර්තාවක් ලෙස බත්තල්/බංකර් වැඩිවීම් ගෙවීම් සඳහා බැංකු කොමිස් ගාස්තු. තවමත් ගැලපීම් සිදු කර නැත.
	828,328,152	

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

25 වාර්තා කරනු ලබන දිනට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු සහ වාර්තා කරනු ලබන දිනට පසුව සිදුවන සුවිශේෂී සිදුවීම්. එහෙත් වාර්තා කරනු ලබන දිනට පසුව කිසිඳු සුවිශේෂී සිදුවීම් සිදුවී නොමැත.

26 නඩු කටයුතුවල සාරාංශය

නඩු අංකය	පෙත්සම්කරු	වගඋත්තරකරු	වසර ආරම්භයේදී ධාරණ අගය	වසර අවසානේ දී ධාරණ අගය - Dr/ (Cr)- රු.
CHC/ARB 1274/2022	සීමාසහිත ලංකා ගල්අඟුරු සංස්ථාව	Liberty Commodities Ltd	236,785,640	236,785,640

* 3% ක වාර්ෂික පොලියක් සහ රු.මිලියන 10 ක බේරුම්කරණ පිරිවැය සමග හිමිකම් පාන්නාට (ලංකා ගල් අඟුරු සමාගම) ඇමෙරිකානු ඩොලර් 1,575,141.86 ක් ගෙවන ලෙස වගඋත්තරකරුට නියම කිරීමට, 2021/12/31 දින බේරුම්කරණයෙන් නියෝගයක් සහ/හෝ තීන්දුවක් ලැබුණි. එසේම ඉහත කරුණ සම්බන්ධයෙන් කොළඹ වාණිජ මහාධිකරණයේ තීන්දුව 2023.08.08 දින ලංකා ගල් අඟුරු සමාගමට (LCC) පක්ෂව ප්‍රකාශයට පත් කරන ලද අතර බේරුම්කරණ තීන්දුව බලාත්මක කිරීමට නියෝගයක් නිකුත් කරන ලදී. ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් හි වත්කම් සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නීතිපතිවරයා විසින් 2023 නොවැම්බර් 06 වැනි දින ලංකා ගල් අඟුරු සමාගම (LCC) වෙත ලිපියක් යවා ඇත. ලිබර්ටි කොමොඩිටීස් සඳහා වත්කම් විස්තර ඉල්ලා රේඛීය අමාත්‍යාංශය හරහා එක්සත් රාජධානියේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් වෙත ලිපියක් යවා ඇත. මෙම ලැබිය යුතු දෑ, අනෙකුත් ජංගම නොවන වත්කම් - ලිබර්ටි කොමොඩිටීස් ලිමිටඩ් යටතේ සටහන 11 මගින් පිළිබිඹු වේ.

පීටී.ඒෂියන් මයිනින් ඇන්ඩ් රිසෝසස් සමාගම - නඩු අංකය - CHC 218/2020 MR

පීටී වෙතින් වී.ජ.ඩෝ. 300,000/- මුදල් ඉල්ලා සමාගම විසින් නඩුවක් ගොනු කරන ලදි. ඒෂියන් මයිනින් ඇන්ඩ් රිසෝසස් සමාගම විසින් අංක එල්සීසී/20-21/එස්ටී/19/2 ක්ෂණික ටෙන්ඩරයේ අදාල ලංසු සුරක්ෂිතයේ දැක්වෙන කොන්දේසි උල්ලංඝනය කර ඇත. වී.ජ.ඩෝ. 300,000/- සඳහා අංක බීටී/බී 0090651 දරණ ලංසු සුරක්ෂිතය මුදල් බවට පත්කිරීමට ගෙවීම් සිදුකිරීම වලක්වාලමින් කොළඹ මහාධිකරණය විසින් බැංකුව වෙත වාරණ නියෝගයක් නිකුත් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

28 සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

28.1 සම්බන්ධිත පාර්ශවයන් හඳුනා ගැනීම

සම්බන්ධිත පාර්ශවයන් ලෙස අර්ථ දක්වා කර ඇති පාර්ශවයන් සමඟ සමාගම විසින් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී LKAS 24 ලසම්බන්ධිත පාර්ශව හෙලිදරව් කිරීම්ල යටතේ ගනුදෙනු සිදුකරනු ලබන අතර එහි විස්තර පහත ලැයිස්තුගත කර ඇත.

28.2 වෙනත් අධ්‍යක්ෂ පදවි දරණ අධ්‍යක්ෂකවරුන් සිටින සමාගම් සමඟ ගනුදෙනු

යම් සමාගමක සභාපති හෝ අධ්‍යක්ෂකවරයෙකු වෙනත් අස්ථිත්‍යයක සභාපති හෝ අධ්‍යක්ෂකවරයෙකු වූවිට එවැනි අස්ථිත්‍ය සමඟ සමාගම ගනුදෙනු කරනු ලැබූ අතර ඒ සම්බන්ධ විස්තර පහත පරිදි වේ.

(i) අධ්‍යක්ෂකවරුන්ට ලබාදෙන ලද ණය
සමාගමේ අධ්‍යක්ෂකවරුන්ට ණය ලබාදී නොමැත

		2023	2022
(ii)	ප්‍රධාන කළමනාකරණ පිරිස් හානි පූරණය	රු.	රු.
	අධයක්ෂක ගාස්තු	1,000,000	600,000
(iii)	සභාපති/කළමනාකාර අධ්‍යක්ෂවරයාට දීමනා	2,549,697	2,458,122

28.3 මව් සහ සම්බන්ධිත අස්ථිත්‍ය සමග ගනුදෙන

පහත දැක්වෙන වගුව මගින් අදාල මූල්‍ය වර්ෂය සඳහා අදාල පාර්ශවයන් සමඟ ඇතළත් වූ ගනුදෙනුවල මුළු අගය දක්වා ඇත.

29 ප්‍රාග්ධන බැඳීම්

මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතු හෝ හෙලිදරව් කළ යුතු දිනට ප්‍රමාණාත්මක ප්‍රාග්ධන බැඳීම් නොතිබුණි.

	ලංකා විදුලි බල මණ්ඩලය පරිපාලක සමාගම		ලංකා නැව් සංස්ථාව කොටස්කරු		එකතුව	
	රු. 2023	රු. 2022	රු. 2023	රු. 2022	රු. 2023	රු. 2022
ගනුදෙනුවේ ස්වභාවය						
ජනවාරි 01 වෙනි දිනට	(2,404,598,629)	4,766,394,632	(547,748,168)	(675,376,070)	(2,952,346,797)	4,091,018,562
වැට් බදු සමඟ ගල් අඟුරු විකුණුම්	185,540,881,973	129,183,194,789			185,540,881,973	129,183,194,789
වියදම් ප්‍රතිපූරණය	74,629,080	69,008,169			74,629,080	69,008,169
මුදල් වට්ටම්	(14,904,628,637)	(9,419,651,697)			(14,904,628,637)	(9,419,651,697)
ESC සහ ආදායම් බදු	2,578,076	(578,180,021)			2,578,076	(578,180,021)
ලැබිය යුතු සඳහා ගැලපීම්	1,182,772,437	(136,613)			1,182,772,437	(136,613)
නැව් ගාස්තු				(454,455,775)	-	(454,455,775)
බත්තල් ගාස්තු			(2,056,991,739)	(1,060,503,362)	(2,056,991,739)	(1,060,503,362)
CSC සඳහා අනෙකුත් ගාස්තු			(75,414,000)	(294,400)	(75,414,000)	(294,400)
ගෙවිය යුතු සඳහා ගැලපීම්				(3,079,499)	-	(3,079,499)
මුදල් ලැබීම්	(139,106,321,426)	(126,425,227,888)			(139,106,321,426)	(126,425,227,888)
මුදල් ගෙවීම්			2,382,674,601	1,645,960,938	2,382,674,601	1,645,960,938
දෙසැම්බර් 31 වෙනි දිනට	**30,385,312,874**	**(2,404,598,629)**	**(297,479,307)**	**(547,748,168)**	**30,087,833,568**	**(2,952,346,797)**
ඇතුළත් වේ						
වෙළඳ ණයගැතියන් (CEB)	31,692,270,437	7,570,163,218			31,692,270,437	7,570,163,218
ලැබිය යුතු විනිමය අලාභය (Cotecna)	51,632	5,267,644			51,632	5,267,644
ලැබිය යුතු බදු	4,611,002	2,032,926			4,611,002	2,032,926
අවසාන වැට් බදු සහ ලැබිය යුතු අනෙකුත්	197,452,711	197,452,711			197,452,711	197,452,711
කළමනාකරණ ගාස්තු	104,012,222	68,577,677			104,012,222	68,577,677
ලැබිය යුතු BOC ණය පොලී	191,835,779					191,835,779
ලංවිමෙන් ලද අත්තිකාරම්	(1,089,955,474)	(9,533,127,371)			(1,089,955,474)	(9,533,127,371)
ලිබර්ටි සහ ටෝරියන් මත ගෙවිය යුතු	(714,965,434)	(714,965,434)			(714,965,434)	(714,965,434)
ලංකා නැව් සංස්ථාව - පැරණි			(34,562,813)	(34,562,813)	(34,562,813)	(34,562,813)
ලංකා නැව් සංස්ථාව - නව			(688,645,343)	(513,185,356)	(688,645,343)	(513,185,356)
CSC වෙත ගෙවූ අත්තිකාරම්			425,728,849	-	425,728,849	-
	30,385,312,874	**(2,404,598,629)**	**(297,479,307)**	**(547,748,168)**	**30,087,833,568**	**(2,952,346,797)**

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

	අමතර සටහන්	2023 රු.	2022 රු.
ආදායම	(අ)	161,408,218,035	117,406,287,221
සෘජු වියදම් (විකුණුම් පිරිවැය)		(161,333,588,954)	(117,337,279,052)
දළ ලාභය		**74,629,080**	**69,008,169**
අනෙකුත් ආදායම්	(ආ)	**19,004,116**	**8,221,503**
පරිපාලන වියදම්	(ඇ)	(74,286,749)	(78,525,284)
මෙහෙයුම්වලින් ලද ලාභය		19,346,447	(1,295,612)
මූල්‍ය ආදායම්	(ඈ)	**8,996,047**	**1,360,766**
මූල්‍ය පිරිවැය	(ඉ)	(28,342,495)	(65ළ154)
බදු පෙර ලාභය		-	-
ආදායම් බදු වියදම්	(ඊ)	-	-
වර්ෂය සඳහා ලාභය		-	-

(අ)

	2022	2021
ආදායම		
පිරිවැටුම	161,333,588,954	117,337,279,052
ලංවිම මගින් වියදම් ප්‍රතිපූරණය කිරීම	74,629,080	69,008,169
	161,408,218,035	117,406,287,221

(අ.1)

ශුද්ධ මොදුකාර්ය පිරිවැය ගණනය කිරීම		
පරිපාලන වියදම්	(74,286,749)	(78,525,284)
මූල්‍ය පිරිවැය	(28,342,495)	(65,154)
ලියාපදිංචි සහ අනෙකුත් ආදායම්	19,004,116	8,221,503
මූල්‍ය ආදායම්	8,996,047	1,360,766
කාල සීමාව (මාස 12) සඳහා ශුද්ධ මොදු කාර්ය පිරිවැය	(74,629,080)	(69,008,169)

(ආ)

ලියාපදිංචි අනෙකුත් ආදායම්		
ලියාපදිංචි කිරීමේ ආදායම්	18,995,616	5,440,200
ලංසු ලේඛන ගාස්තු	-	2,752,043
අනෙකුත් ආදායම්	8,500	29,260
	19,004,116	8,221,503

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

	අමතර සටහන්	2023 රු.	2023 රු.	2022 රු.
(ඇ) **පරිපාලන වියදම්**				
සභාපති/අධ්‍යක්ෂක ගාස්තු		1,000,000	480,000	600,000
කළමනාකාර අධ්‍යක්ෂකවරුන්ගේ වටුප්		1,200,000	5,425,872	1,170,968
වැටුප් - විධායක		21,387,542	22,577,724	24,591,047
වැටුප් - අනිකුත් කාර්යමණ්ඩල		8,707,560	8,772,132	11,106,315
අතිකාල		3,508,041	3,548,506	4,349,806
නිවාඩුදින වැටුප්		57,505	378,779	102,171
ප්‍රදාද දීමනා		*	3,064,644	489,425
ප්‍රයෝජනයට නොගත් අසනීප නිවාඩු සඳහා ගෙවීම්		*	3,064,644	32,182
සේවක අර්ථසාධක අරමුදල		3,594,369	4,458,541	4,295,944
සේවා නියුක්තයින්ගේ භාර අරමුදල		898,592	1,114,635	1,073,986
කාර්යමණ්ඩලයේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය		1,726,256	1,659,087	1,508,261
සේවක සුභසාධනය		1,142,580	1,179,802	887,159
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		1,467,000	1,306,244	2,559,190
කාර්යාලය සඳහා කුලී		2,172,126	2,081,079	1,947,070
විදුලිය		1,584,367	1,644,756	1,340,218
ජලය		221,558	192,760	191,989
දුරකථන		732,914	969,600	725,515
තැපැල් සහ කුරියර් සේවා		71,578	20,000	14,210
පොත්, පුවත්පත් සහ වාර සඟරා		126,280	100,000	104,140
ලිපි ද්‍රව්‍ය		2,447,776	2,000,000	2,841,225
වෙබ් අඩවිය, අන්තර් ජාලය සහ විද්‍යුත් තැපෑල		797,597	100,000	118,000
මෝටර් රථ ධාවන වියදම්		4,182,197	3,299,866	3,477,769
කළමනාකරණය සඳහා ප්‍රවාහන දීමනාව		2,450,000	2,400,000	2,385,484
මෝටර් රථ අලුත්වැඩියා කිරීම්		2,326,670	1,500,000	1,148,063
විවිධ අයිතම		2,427,604	260,000	842,313
රේගු සහ ආගමන නිලධාරීන් සඳහා වියදම්		1,166,408	600,000	537,044
කාර්යාලීය උපකරණ අලූත්වැඩියා කිරීම		537,542	1,400,823	1,229,673
කාර්ය මණ්ඩලය ගමන් වියදම්		82,258	100,000	76,716
ටෙන්ඩර් දැන්වීම් වියදම්		1,155,830	100,000	466,200
ටෙන්ඩර් වියදම්		552,885	611,013	325,610
කාර්යලය නඩත්තු කිරීම්		402,245	673,137	353,250

මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

වෘත්තීය ගාස්තු	1,295,729	1,266,742	2,149,281
උපදේශන ගාස්තු	397,000	870,000	965,992
ආරක්ෂක සේවා	1,107,385	985,500	954,980
මුද්දර ගාස්තු	18,277	7,500	5,054
ක්ෂයවීම්	2,713,713	2,866,948	2,844,726
විගණන ගාස්තු	515,200	500,000	500,000
රක්ෂණ	112,163	141,275	130,323
කොවිඩ්-19 ට අදාල වියදම්	-	300,000	83,983
	74,286,749	**82,021,609**	**78,525,284**

(අ) මූල්‍ය ආදායම්

ස්ථාවර තැන්පතු මත පොලී	7,923,843	-	981,068
ඉතිරි කිරීමේ ගිණුම් මත පොලී	183,835	110,000	131,567
කාර්යමණ්ඩලය සඳහා ලබාදුන් ණය මත පොලී	215,523	205,620	248,130
හැසිරවීමේ ගාස්තු - SGS, ප්‍රමාද ගාස්තු වැනි..	672,847	100,000	-
	8,996,047	**415,620**	**1,360,766**

(ඉ) මූල්‍ය හිඟවැය

බැංකු ගාස්තු*	939,365	172,531	65,154
විජඩොා ගිණුම්වල විනිමය අලාභය	27,403,130	-	-
	28,342,495	**172,531**	**65,154**

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PWR/B/LCC/1/2023/30 මඹේ අංකය உமது இல Your No. දිනය Date 2024 සැප්තැම්බර් 25

සභාපති
සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක හිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා හිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) SLFRS 9 හි ඡේද අංක 5.5.15 (අ) අනුව වසරකට වැඩි කාලයක් සඳහා ගෙවීමට තිබූ රු.මිලියන 1,553 ක වෙළඳ ලැබිය යුතු දෑ සඳහා සමාගම වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(ආ) ගල් අඟුරු ආනයනය කිරීමේදී, රේගු අරමුණු සඳහා වටිනාකම නිශ්චය කර ගැනීමේ සංකේතාත්මක ගැලපුමක් ලෙස ඇත්ත වශයෙන්ම සිදු නොවූ, රේගුවේ වටිනාකම සඳහා පිරිවැයට සියයට 10 ක ආන්තිකයක් එකතු කරන ලදී. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුල සමාගම විසින් රු. මිලියන 14,904.63 ක් වූ පිරිවැය මත සියයට 10 ක ආන්තිකයක් ආදායමට එකතු කර ඇති අතර පසුව සමාගම ණය ගැතියන්ට එම වටිනාකම වට්ටමක් ලෙස හඳුනාගෙන විකුණුම් පිරිවැයට ගලපා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය සඳහා විකුණුම් පිරිවැය සහ ආදායම් SLFRS 15 හි නියම කර ඇති ප්‍රතිපාදනවලට පටහැනිව සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් දෙන ලද උපදෙස් අනුව ඉහත ගැලපීම් සමාගම විසින් ගිණුම්ගත කර තිබුණි.කෙසේ වෙතත්, මූල්‍ය ප්‍රකාශනවල එය හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේ වසර දෙකකට වැඩි වෙළඳ ලැබිය යුතු ශේෂයන් සහ විවිධ ණයගැතියන් රු. මිලියන 17.86 ක එකතුවක් සහ ගෙවිය යුතු හිඟ ශේෂයන් වන රු. මිලියන 99.96 කට අදාළ ඉන්වොයිසි, සවිස්තරාත්මක උපලේඛන සහ ශේෂ තහවුරු කිරීම් වැනි අදාළ ලේඛනමය සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) සමාලෝචනයට භාජනය වන වර්ෂය අවසානයේ පිළිවෙලින් රු. මිලියන 197.45 ක් සහ රු. මිලියන 44.58 ක් වූ ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් ලැබිය යුතු අවසාන වැට් බදු, කළමනාකරණ ගාස්තුව සහ ආදායම් බදු වලට අදාළ ශේෂ තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, එම ශේෂයන් ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමියි.

සමාගමේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) SLFRS 9 හි ඡේද අංක 5.5.15 (අ) අනුව වසරකට වැඩි කාලයක් සඳහා ගෙවීමට තිබූ රු.මිලියන 1,553 ක වෙළඳ ලැබිය යුතු දෑ සඳහා සමාගම වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(ආ) ගල් අඟුරු ආනයනය කිරීමේදී, රේගු අරමුණු සඳහා වටිනාකම නිශ්චය කර ගැනීමේ සංකේතාත්මක ගැලපුමක් ලෙස ඇත්ත වශයෙන්ම සිදු නොවූ, රේගුවේ වටිනාකම සඳහා පිරිවැයට සියයට 10 ක ආන්තිකයක් එකතු කරන ලදී. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුල සමාගම විසින් රු. මිලියන 14,904.63 ක් වූ පිරිවැය මත සියයට 10 ක ආන්තිකයක් ආදායමට එකතු කර ඇති අතර පසුව සමාගම ණය ගැතියන්ට එම වටිනාකම වට්ටමක් ලෙස හඳුනාගෙන විකුණුම් පිරිවැයට ගලපා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය සඳහා විකුණුම් පිරිවැය සහ ආදායම් SLFRS 15 හි නියම කර ඇති ප්‍රතිපාදනවලට පටහැනිව සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් දෙන ලද උපදෙස් අනුව ඉහත ගැලපීම් සමාගම විසින් ගිණුම්ගත කර තිබුණි.කෙසේ වෙතත්, මුල්‍ය ප්‍රකාශනවල එය හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේ වසර දෙකකට වැඩි වෙළඳ ලැබිය යුතු ශේෂයන් සහ විවිධ ණයගැතියන් රු. මිලියන 17.86 ක එකතුවක් සහ ගෙවිය යුතු හිඟ ශේෂයන් වන රු. මිලියන 99.96 කට අදාළ ඉන්වොයිසි, සවිස්තරාත්මක උපලේඛන සහ ශේෂ තහවුරු කිරීම් වැනි අදාළ ලේඛනමය සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) සමාලෝචනයට භාජනය වන වර්ෂය අවසානයේ පිළිවෙලින් රු. මිලියන 197.45 ක් සහ රු. මිලියන 44.58 ක් වූ ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් ලැබිය යුතු අවසාන වැට් බදු, කළමනාකරණ ගාස්තුව සහ ආදායම් බදු වලට අදාළ ශේෂ තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, එම ශේෂයන් ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමියි.

සමාගමේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2 (ආ), (ඇ), (ඈ) සහ (ඉ) හි දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නිතීරීති / විධානයට යොමුව	නිරීක්ෂණය
((අ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 90 (1) වගන්තිය	සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළ කාර්තුමය වශයෙන් ආදායම් බදු වාරික පනතේ විධිවිධානවලට අනුව ගෙවා නොතිබුණි.
(ආ) 2002 අංක 14 දරන චකිතු කළ අගය මත බදු පනතේ 26(1) වගන්තියට අනුව (2014.01.01 දින දක්වා සංශෝධන ඇතුළත් කරමින්)	බදු ගෙවිය යුතු කාලය අවසන් වීමෙන් පසු මාසයේ විසිවන දින හෝ ඊට පෙර යම් බදු කාල සීමාවක් සම්බන්ධයෙන් බදු ගෙවනු ලැබේ. කෙසේ වෙතත්, එම ප්‍රතිපාදනයට අනුව සමාගම වැට් බදු ගෙවා නොතිබූ අතර 2023 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වැට් බදු රු.මිලියන 20,930.73 ක්ව තිබුණි.
(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය*මාර්ගෝපදේශ 4.2	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව වාර්ෂික ගල් අඟුරු අවශ්‍යතාවය ප්‍රසම්පාදනය කිරීම සඳහා සමාගම විසින් සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සහ කාලසටහනක් සකස් කළ යුතු අතර ඒ සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. කෙසේ වෙතත්, සමාගම විසින් නිසි සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උආ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

කොන්ත්‍රාත් ගිවිසුමේ එකඟ වූ පරිදි සැපයුම්කරුට අත්තිකාරම් ගෙවීමට සමාගම අපොහොසත් වී තිබුණි.එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය තුළ නැවිගත කිරීම් තුනක් සඳහා සමාගම විසින් පැටවුම් වරායේ ප්‍රමාද ගාස්තු ලෙසරු.මිලියන 137.88 ක මුදලක් ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ කටයුතු සම්බන්ධයෙන් 2023 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා සමාගමේ නිරීක්ෂණ

ඔබේ අංකය : PWR/B/LCC/1/2023/30
2024 ඔක්තෝම්බර් 03

වෙත : විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය වෙත,

හිතවත් මහතාණෙනි,

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

ඉහත සඳහන් කළ නිරීක්ෂණ සම්බන්ධයෙන් 2024.09.30 දින අප වෙත ලද විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු මෙහි ඉදිරිපත් කර ඇත.

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

1.2 (අ) සඳහා පිළිතුර

සමාගම විසින් ලැබිය යුතු දෑ සාමූහිකව හානිකරණය සඳහා ඇගයීමට ලක් කළ අතර, තනිව සැලකිය යුතු ලැබිය යුතු දෑවල හානිකරණය සඳහා ප්‍රතිපාදන අවශ්‍ය නොවන බව සොයා ගන්නා ලදී. එයට හේතුව ලැබිය යුතු දෑවලට අනුරූප ගෙවිය යුතු දෑ මඟින් පිටුබලය ලබා දීම සහ පැහැර හැරීමක් සිදුවුවහොත්, පියවීමේ හැකියාවක් පවතී. මෙයින් අදහස් කරන්නේ හානිකරණය සඳහා කිසිදු පැහැර හැරීමේ ගාස්තුවක් අය කිරීමට හෙළිදරව් කිරීම් අවශ්‍ය නොමැති බවයි. එසේම, ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (LCC) විසින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගල් අඟුරු බෙදා හැරීමෙන් කිසිදු ලාභයක් නොලබන අතර, වෙළඳ ලැබිය යුතු දේ සඳහා කිසියම් ප්‍රතිපාදනයක් තිබේ නම්, කළමනාකරණ ගාස්තුවක් ලෙස 18% අගය එකතු කළ බද්දක් සමග ලංකා විදුලිබල මණ්ඩලය වෙත අය කළ යුතු වේ. එය ලංකා විදුලිබල මණ්ඩලය සඳහා අමතර වියදමක් වනු ඇත.

1.2 (ආ) සඳහා පිළිතුර

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) විසින් කෑරී වෙත VAT ඉන්වොයිසි නිකුත් කිරීමේදී පිරිවැයට 10% ක රේගු ආන්තිකයක් ඇතුළත් කරන ලෙස LCC වෙත නියෝග කරන ලදී 2018 ජුනි 28 වන දින අමාත්‍යාංශයේදී පැවති රැස්වීමකින් පසුව මෙම මිලකරණ ව්‍යුහය තීරණය කරන ලද අතර, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ (IRD) නිලධාරියෙකු සහභාගී විය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අනුව, ලංකා විදුලිබල මණ්ඩලයේ ඉන්වොයිසිවල VAT සඳහා වන මූලික මුදල රේගු අරමුණු සඳහා වටිනාකමට වඩා අඩු විය නොහැක එබැවින් 10% දේශීය ආදායම් නිලධාරියෙකුගේ උපදෙස් මත පමණක් ඇතුළත් කර ඇත. ආදායමේ කොටසක් වන 10% ක සංකල්පීය ආන්තිකය ඉවත් කිරීමෙන් නිමැවුම් ඒඕ ගණනය කිරීමේ හැකියාව පිළිබඳව ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ද විමසා ඇති අතර තවමත් ප්‍රතිචාරයක් ලැබී නොමැත. තවද, 2022 අප්‍රේල් 4 වන දින, ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයා ගල් අඟුරු ආනයනය සහ සැපයුම සඳහා VAT නිදහස් කිරීමක් ඉල්ලා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට ලිපියක් ලියන ලදි. විගණන නිරීක්ෂණවල සඳහන් කර ඇති පරිදි, ඉහත තීන්දුව SLFRS 15 (ගනුදෙනුකරුවන්ගෙන් කොන්ත්‍රාත්තු වලින් ලැබෙන ආදායම) හි දක්වා ඇති විධිවිධානවලට පටහැනි වන අතර, වැඩිදුර පැහැදිලි කිරීම් සඳහා අපි මෙය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය වෙත යොමු කරන්නෙමු, අවශ්‍ය නම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඊළඟ මූල්‍ය වර්ෂයේදී වෙනස්කම් සිදු කරනු ලැබේ.

1.2(ඇ) සඳහා පිළිතුර

i. සීමාසහිත ලිබර්ටි කොමඩිටිස් වෙතින් ලැබිය යුතු 50% වූ SGS ගාස්තු රු.8,048,531

2015/16 වාරයේ නැව් වාර 17ක් සඳහා ගොඩබාන වරායේදී නැව් තොගයේ බර මිණුම්කරණ ගාස්තු ද ඇතුළත් වේ. අත්සන් කරන ලද ගිවිසුම මත පදනම්ව මෙම ගෙවීම සිදු කරන ලෙස එම්/එස් සීමාසහිත ලිබර්ටි

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ කටයුතු සම්බන්ධයෙන් 2023 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා සමාගමේ නිරීක්ෂණ

ඔබේ අංකය : PWR/B/LCC/1/2023/30
2024 ඔක්තෝම්බර් 03

වෙත : විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය වෙත,

හිතවත් මහතාණෙනි,

සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගමේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

ඉහත සඳහන් කළ නිරීක්ෂණ සම්බන්ධයෙන් 2024.09.30 දින අප වෙත ලද විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු මෙහි ඉදිරිපත් කර ඇත.

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

1.2 (අ) සඳහා පිළිතුර

සමාගම විසින් ලැබිය යුතු දෑ සාමූහිකව හානිකරණය සඳහා ඇගයීමට ලක් කළ අතර, තනිව සැලකිය යුතු ලැබිය යුතු දෑවල හානිකරණය සඳහා ප්‍රතිපාදන අවශ්‍ය නොවන බව සොයා ගන්නා ලදී. එයට හේතුව ලැබිය යුතු දෑවලට අනුරූප ගෙවිය යුතු දෑ මඟින් පිටුබලය ලබා දීම සහ පැහැර හැරීමක් සිදුවුවහොත්, පියවීමේ හැකියාවක් පවතී. මෙයින් අදහස් කරන්නේ හානිකරණය සඳහා කිසිදු පැහැර හැරීමේ ගාස්තුවක් අය කිරීමට හෙළිදරව් කිරීම් අවශ්‍ය නොමැති බවයි. එසේම, ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (LCC) විසින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගල් අඟුරු බෙදා හැරීමෙන් කිසිදු ලාභයක් නොලබන අතර, වෙළඳ ලැබිය යුතු දේ සඳහා කිසියම් ප්‍රතිපාදනයක් තිබේ නම්, කළමනාකරණ ගාස්තුවක් ලෙස 18% අගය එකතු කළ බද්දක් සමග ලංකා විදුලිබල මණ්ඩලය වෙත අය කළ යුතු වේ. එය ලංකා විදුලිබල මණ්ඩලය සඳහා අමතර වියදමක් වනු ඇත.

1.2 (ආ) සඳහා පිළිතුර

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) විසින් කෑදී වෙත VAT ඉන්වොයිසි නිකුත් කිරීමේදී පිරිවැයට 10% ක රේගු ආන්තිකයක් ඇතුළත් කරන ලෙස LCC වෙත නියෝග කරන ලදී 2018 ජුනි 28 වන දින අමාත්‍යාංශයේදී පැවති රැස්වීමකින් පසුව මෙම මිලකරණ ව්‍යුහය තීරණය කරන ලද අතර, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ (IRD) නිලධාරියෙකු සහභාගී විය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට අනුව, ලංකා විදුලිබල මණ්ඩලයේ ඉන්වොයිසිවල VAT සඳහා වන මූලික මුදල රේගු අරමුණු සඳහා වටිනාකමට වඩා අඩු විය නොහැක එබැවින් 10% දේශීය ආදායම් නිලධාරියෙකුගේ උපදෙස් මත පමණක් ඇතුළත් කර ඇත. ආදායමේ කොටසක් වන 10% ක සංකල්පීය ආන්තිකය ඉවත් කිරීමෙන් නිමැවුම් ඒඹ ගණනය කිරීමේ හැකියාව පිළිබඳව ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ද විමසා ඇති අතර තවමත් ප්‍රතිචාරයක් ලැබී නොමැත. තවද, 2022 අප්‍රේල් 4 වන දින, ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයා ගල් අඟුරු ආනයනය සහ සැපයුම සඳහා VAT නිදහස් කිරීමක් ඉල්ලා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට ලිපියක් ලියන ලදි. විගණන නිරීක්ෂණවල සඳහන් කර ඇති පරිදි, ඉහත තීන්දුව SLFRS 15 (ගනුදෙනුකරුවන්ගෙන් කොන්ත්‍රාත්තු වලින් ලැබෙන ආදායම) හි දක්වා ඇති විධිවිධානවලට පටහැනි වන අතර, වැඩිදුර පැහැදිලි කිරීම් සඳහා අපි මෙය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය වෙත යොමු කරන්නෙමු, අවශ්‍ය නම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඊළඟ මූල්‍ය වර්ෂයේදී වෙනස්කම් සිදු කරනු ලැබේ.

1.2(ඇ) සඳහා පිළිතුර

i. සීමාසහිත ලිබර්ටි කොමඩිටීස් වෙතින් ලැබිය යුතු 50% වූ SGS ගාස්තු රු.8,048,531

2015/16 වාරයේ නැව් වාර 17ක් සඳහා ගොඩබාන වරායේදී නැව් තොගයේ බර මිණුම්කරණ ගාස්තු ද ඇතුළත් වේ. අත්සන්

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ කටයුතු සම්බන්ධයෙන් 2023 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා සමාගමේ නිරීක්ෂණ

කරන ලද ගිවිසුම මත පදනම්ව මෙම ගෙවීම සිදු කරන ලෙස එම්/එස් සීමාසහිත ලිබර්ටි කොමඩිටීස් පීටීඊ වෙත දන්වමින් 2019 දී එවන ලද විද්‍යුත් තැපෑලක් අමුණා ඇති අතර මේ සම්බන්ධයෙන් බේරුම්කරණ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.

ii. **විවිධ ණය ගැතියන් - රු. 9,808,968.00**
විවිධ ණය ගැතියන්ගේ ආපසු අයකරගත නොහැකි NBT සහ PAL වලින් සමන්විත වන බව මූලික විමර්ශනවලදී අනාවරණය වී ඇත.

iii. **නොබෙල් රෙසෝර්සස් ඉන්ටනැෂනල්ට ගෙවිය යුතු - රු.84,771,789.21.**
ශේෂය ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ ණයවර ලිපි (LC) වලංගු කාලසීමාව අවසන් වීම හේතුවෙන් නොබෙල් රෙසෝර්සස් ඉන්ටනැෂනල් (පුද්) සමාගමට ලබා ගන්නා ලද අඩු මුදලකි. ගල් අඟුරු ආශ්‍රිත ගෙවීම් සහ කළමනාකරණ ගාස්තු සඳහා අප විසින් කරන ලද ඇතැම් හිමිකම් පෑම් හේතුවෙන් මෙහෙයුම් අවශ්‍යතා මත පදනම්ව ගෙවිය යුතු අනෙකුත් ගෙවීම් පියවීම සඳහා මෙම අරමුදල් භාවිතා කරන ලද අතර, යම් කාලයක් දක්වා ලංකා විදුලිබල මණ්ඩලය සතුව හිඟ මුදල් තිබුණි.

iv. SGS **ලංකා (පුද්ගලික) සමාගම රු.12,161,313.00**
සීමාසහිත SGS ලංකා (පුද්ගලික) සමාගම වෙතින් ලැබුණු අදාළ සන්නිවේදනය මේ සමග අමුණා ඇත.

1.2(ඈ) සඳහා පිළිතුර

i. මෙම අවසන් වැට් බදු නැවිගත කිරීමේ අංක 123 සිට 154 දක්වා සම්බන්ධ වේ. .ශ්‍රී ලංකා රේගුව විසින් කරන ලද විමර්ශනයට අනුව, ලංකා ගල් අඟුරු සමාගම 2016/09/19 සිට 2018/04/09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරුවල නිවැරදි ගනුදෙනු වටිනාකම් ප්‍රකාශ කර නොමැති අතර රේගු නිලධාරීන්ගේ උපදෙස් අනුව ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් විසින් ගෙවිය යුතු වැට් බදු ගණනය කර ඇති අතර, ඉහත නැවිගත කිරීම් සඳහා රු. 195,780,909 ක් ගෙවීමට ඇති බව සොයා ගන්නා ලදී. ඊට අමතරව එම නැවිගත කිරීම්වලට අදාළ විනිමය අලාභය සඳහා රු. 1,671,802 ක් ගෙවීමට ලංකා ගල් අඟුරු සමාගම ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් ඉල්ලා සිටින ලදී. 2023 වර්ෂ අවසාන විගණන අරමුණ සඳහා, ලංකා ගල් අඟුරු සමාගම විසින් ඉහත ශේෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් තහවුරු කිරීම ඉල්ලා ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන අවසන් කරන විටත් ඔවුන් තහවුරු කර නොමැත.වෙනස නිරාකරණය කර ගැනීම සඳහා කළමනාකාරිත්වයේ සාකච්ඡා අඛණ්ඩව සිදු වෙමින් පවතී.

ii. **ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් ලැබිය යුතු කළමනාකරණ ගාස්තුව රු. 39,332,485.00**
මෙම ශේෂය ලංකා විදුලිබල මණ්ඩලයෙන්ද තහවුරු කරන ලෙස ලංකා ගල් අඟුරු සමාගම විසින් ඉල්ලා ඇතත්, මූල්‍ය ප්‍රකාශන අවසන් කරන විටත් ඔවුන් විසින් තහවුරු කර නැත . 2024 ජුනි 30 වන දින වන විට, 2016, 2018, 2019 සහ 2020 වසර සඳහා ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු ශුද්ධ පොදු කාර්ය පිරිවැයේ ශේෂය පිළිබඳව වාද කරමින් පවතී. ලංකා විදුලිබල මණ්ඩලය සමග ව්‍යාපාරික ගනුදෙනුව සඳහා සියලු වියදම් සිදු කර ඇති බැවින් මෙය විසඳීම සඳහා කළමනාකරණ සාකච්ඡාවක් ද පවතී.

iii. **ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් ලැබිය යුතු ආදායම් බදු - රු. 4,611,002.00**
ලංකා විදුලිබල මණ්ඩලය වෙත ගල් අඟුරු බෙදා හැරීමෙන් ලංකා ගල් අඟුරු සමාගම කිසිදු ලාභයක් නොලබන බැවින්, ආදායම් බදු වියදම ද ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් ආපසු ගෙවීමට සුදුසුකම් ලබයි. ලංකා ගල් අඟුරු සමාගම මෙම ශේෂය ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් තහවුරු කරන ලෙස ඉල්ලා ඇත, නමුත් මූල්‍ය ප්‍රකාශන අවසන් කරන විට ඔවුන් තහවුරු කළේ නැත.

.

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ කටයුතු සම්බන්ධයෙන් 2023 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා සමාගමේ නිරීක්ෂණ

2.2.2. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල වන ලෙස ක්‍රියා කර ඇති බව

2017 අංක 24 දරන දේශීය ආදායම් දෙපාර්තමේන්තු පනතේ 2.2.2 (අ). වගන්තිය සඳහා පිළිතුර - 90 (1) වගන්තිය

ගෙවිය යුතු හිඟ බදු සඳහා අප දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග අබණ්ඩව සාකච්ඡා කරමින් සිටින අතර 2022/2023 තක්සේරු වර්ෂය සඳහා ප්‍රතිලාභ මත පදනම්ව අවසාන බදු වගකීම අපි පියවන්නෙමු.

2.2.2 (ආ) සඳහා පිළිතුරු

මූල්‍ය ප්‍රකාශන සටහන අංක 21.2 හි සඳහන් පරිදි, 2023 දී ලංවිමෙහි ද්‍රවශීලතා සීමාවන් හේතුවෙන් 2022*2023 ගල් අඟුරු වාරයේ සිට තාවකාලික වැට් බදු ගෙවීම් කල් දැමීමට විදුලිබල අමාත්‍යාංශය හරහා කරන ලද ඉල්ලීමකට මුදල් අමාත්‍යාංශය අවසර ලබා දුන්නේය. හිඟ ශේෂය නැව් වාරයෙන් වාරයට පියවනු ලබන අතර දැන් ගෙවිය යුතු ශේෂය රු.බිලියන 1.3 ක් පමණ වේ.

2.2.2 (ආ) සඳහා පිළිතුර

සෑම ගල් අඟුරු වාරයක්ම ආරම්භ වීමට පෙර ලංකා ගල් අඟුරු සමාගම විසින් සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සහ කාලසටහනක් ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, 2022-23 වාරය සඳහා සැලැස්ම අසාර්ථක විය. එහි ප්‍රතිඵලයක් ලෙස, දිගුකාලීන ණය විධිවිධානයක් ස්ථාපිත කිරීම ඇතුළුව, ලක්විජය ගල් අඟුරු බලාගාරය (LVPP) වෙත ස්ථාවර ගල් අඟුරු සැපයුමක් සහතික කිරීම සඳහා හොඳම ප්‍රසම්පාදන ක්‍රමය හඳුනා ගැනීම සඳහා ලංකා ගල් අඟුරු සමාගම ආයතනයට අමාත්‍යාංශය සහ ජනාධිපති ලේකම් කාර්යාලය සමග අබණ්ඩ සාකච්ඡාවල නිරත වීමට සිදු විය. ලංකා ගල් අඟුරු සමාගම ආයතනය එම ලේඛන සකස් කර නොමැති වුවද, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ උපදෙස් මත සියලු පියවර ගෙන ඇත. එම ගැටළුකාරී කාල පරිච්ඡේදය තුළ, එම ප්‍රසම්පාදනය ආරම්භ වීමට පෙර සංශෝධිත සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සහ කාලසටහනක් ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොමැත. කෙසේ වෙතත්, ඉදිරියට යන විට, මෙම ක්‍රියා පටිපාටිය දැඩි ලෙස පිළිපදින්නෙමු.

2.3 අනෙකුත් කරුණු සඳහා පිළිතුරු

දිගුකාලීන ණය පදනම් කරගත් ප්‍රසම්පාදන (3) අසාර්ථක වූ බැවින්, බඹක හට පවතින දිගුකාලීන ප්‍රසම්පාදනයෙන් LCC/21/TT/1 කොන්ත්‍රාත්තුවේ නැව්වාරය සඳහා අත්තිකාරම් කිරීමට සිදු විය.

ගෙවීම් ක්‍රමය ණයවර ලිපි පදනම මත ක්‍රියාත්මක විය. කෙසේ වෙතත්, කොවිඩ්-19 වසංගතයේ බලපෑම සහ ලෝකයේ නූ දේශපාලනික තත්ත්වය හේතුවෙන් රට තුළ ඇති වූ ආර්ථික පසුබෑම හේතුවෙන් රටේ ආර්ථික තත්ත්වය දැඩි ලෙස පිරිහී ගියේය. එබැවින් දිගුකාලීන ණය පදනම මත කැඳවන ලද කිසිදු ප්‍රසම්පාදනයක් සාර්ථක නොවීය. තවද, ඉහත තත්ත්වය හේතුවෙන් ජාත්‍යන්තර ෆිච් ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් ශ්‍රී ලංකා මූල්‍ය ආයතනය පහත හෙලනු ලැබීය. එබැවින් කිසිදු ශ්‍රී ලාංකික බැංකුවකින් ණයවර ලිපි විවෘත කිරීමට නොහැකි වූ අතර තවදුරටත් ණයවර ලිපි කිසිදු ජාත්‍යන්තර බැංකුවකින් තහවුරු කර නොමැත. එබැවින්, ණයවර ලිපිවල එකඟ වූ ගිවිසුම් නියමයන්ට අනුව ගල් අඟුරු සැපයීමට සැපයුම්කරු එකඟ නොවීය .

මෙම සන්දර්භය තුළ, නැව් නාමයෝජනාව කිරීමට පෙර 30% ක අත්තිකාරම් ගෙවීමේ ක්‍රමයක් යටතේ, පැටවුම් වරායේ පළමු දිනට ආසන්න වශයෙන් දින 15 කට පෙර සහ ගොඩබෑමට පෙර ශේෂ ගෙවීම් යටතේ ගල් අඟුරු මිලියන 1.125 _/* 10% ඉතිරි ප්‍රමාණය සැපයීමට සැපයුම්කරු එකඟ විය. තවද, සැපයුම්කරු විසින් කිසියම් ගෙවීම් ප්‍රමාදයක් සිදුවුවහොත්, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඇතිව ගැනුම්කරුගේ හිණුම්වලට ගෙවිය යුතු බවට කොන්දේසියක් එකතු කරන ලදී.

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගමේ කටයුතු සම්බන්ධයෙන් 2023 වර්ෂය සඳහා විගණකාධිපතිවරයා විසින් නිකුත් කර ඇති වාර්තාව සඳහා සමාගමේ නිරීක්ෂණ

ඒ අනුව, කොන්ත්‍රාත්තුවේ නව නියමයන්ට අනුකූලව එකඟ වූ පරිදි සැපයුම්කරුට අත්තිකාරම් ගෙවීම සිදු කිරීමට අපට නොහැකි වූ අතර, පැටවුම් වරායේ ප්‍රමාද ගාස්තුව අනුව රු. 137,883,574 ක මුදලක් ගෙවා තිබුණි.

සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම
ෂෙහාන් චින්. සුමනසේකර
සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ



LANKACOAL
COMPANY(PVT)LTD

Lanka Coal Company (Pvt) Ltd.
No. 51/3, Dutugemunu Street, Dehiwala, Sri Lanka.
Tel: +94 112 824 681 / +94 112 824 682
Fax: +94 112 824 689
Email: info@lankacoal.lk
Web: www.lankacoal.lk